Vidyodaya Journal of Humanities and Social Sciences

VJHSS (2025), Vol. 10 (02)

# A Study of the Policies Adopted by Past Rulers for the Protection of Environmental Resources during the Anuradhapura Period

R. K. M. Trileeshiya Indrani
Department of History & Archaeology, University of Sri Jayewardenepura, Sri Lanka

**Article Info**

Article History:
Received 08 Aug 2024
Accepted 28 July 2025
Issue Published Online
01 July 2025

**Key Words:**
Environment
Fauna
Flora
Management
Sustainable

*Corresponding author
E-mail address:
indrani619v@gmail.com

https://orcid.org/0009-0001-2027-950X

Journal homepage:
http://journals.sjp.ac.lk/index.php/vjhss

http://doi.org/10.31357/fhss/vjhss.v10i02.06

VJHSS (2025), Vol. 10 (02), pp. 71-83

ISSN 1391-1937/ISSN 2651-0367 (Online)

©Faculty of Humanities and Social Sciences 2025

## ABSTRACT

*This research was conducted to study the policies adopted by past rulers for the protection of environmental resources, specifically during the Anuradhapura Kingdom period. It was guided by research questions focused on the impact of political strategies adopted by these rulers on the proper management and sustainable use of environmental resources for the benefit of the people. The primary objective of this research was to identify the state policies implemented by ancient rulers for the management of environmental resources. The secondary objectives were to establish the socio-economic value of these resources and to identify the legal methods used by the rulers to protect them. Qualitative research was used in this study. An examination of literary and epigraphic sources reveals that, by this period, state policy regarding the protection and management of environmental resources had become highly developed. The prosperity and progress of ancient Sri Lanka, which had an agricultural economy, depended on the wise management of its natural and water resources, particularly in land use. Therefore, it can be concluded that the planned and sustainable use of environmental resources, such as flora and fauna, water resources, and soil, contributed to a beneficial social environment and significantly impacted state development.*

**මාතෘකාව**

පාරසරික සම්පත්වල ආරක්ෂාව උදෙසා අතීත පාලකයන් විසින් අනුගමනය කළ ප්‍රතිපත්ති පිළිබඳ අධ්‍යයනයක් (අනුරාධපුර පාලන අවධිය)

## 1. හැඳින්වීම

මානව පරිණාමයත් සමඟ ඇති වූ ජනගහණ වර්ධනයත් සමඟ ඔවුන්ට අවශ්‍ය ආහාර සපයා ගැනීමේ දී මිනිසා පරිසර සම්පත් කළමනාකරණය කර ගැනීමට පෙළඹුණි. පරිසර සම්පත් භාවිතයේ දී අතීත මිනිසා එම සම්පත්වලින් ප්‍රයෝජන ගනිමින් ඒවා අනාගතය වෙනුවෙන් ආරක්ෂා කිරීම සඳහා ද කටයුතු කළේය. මානව අවශ්‍යතාවල දී තමන්ට අවශ්‍ය කරන පරිදි පරිසරය සකසා ගැනීම අත්‍යවශ්‍ය කරුණකි. මූලාරම්භයේ දී මානවයා තමන්ගේ අවශ්‍යතා පරිසරයට අවශ්‍ය පරිදි හැඩගස්වා ගත් බව ගල්ගුහාවල පරිසර හිතකාමී සැලැස්ම අධ්‍යයනය කිරීමෙන් පැහැදිලි වේ. නමුත් පසුකාලීන ව එය වෙනසකට බඳුන් වී ඇති අතර තමන්ගේ අවශ්‍යතා අනුව පරිසරය හැඩගස්වා ගැනීමට උත්සාහ දරූ බවත් එම ගල්ගුහා ආශ්‍රිත ව කටාරම් කොටා අවශ්‍යතාවන්ට අනුකූල ව එම ස්ථානයන් සකසා ගත් ආකාරයෙන් පැහැදිලි වේ. පාරිසරික සම්පත් ජීවීන්ගේ පැවැත්මට මහත් සේ උපකාරී වේ. නමුත් මානවයාගේ ක්‍රියාකාරකම් හේතුවෙන් පරිසරයට සිදුවන හානිය අතිමහත් ය. ඒ අනුව පරිසරයට හානි නොකරමින් පාරිසරික සම්පත් තම අවශ්‍යතාවන්ට අනුව කළමනාකරණය කරගෙන ඇත. සම්පත් කළමනාකරණයකින් යුතු ව පරිහරණය කර පරිසරයට කිසිදු හානියක් නොවන ලෙස මුදාහැර අනාගතය සඳහා ද ආරක්ෂා කිරීමටත් එහි වැදගත්කම තේරුම් ගැනීමටත් අතීත මානවයා සමත්කම් දක්වා ඇත. අනුරාධපුර අවධියේ රාජ්‍ය පාලන අවධියේ පාලකයන් විසින් අනුගමනය කරන ලද පරිසර සම්පත් සංරක්ෂණ ප්‍රතිපත්ති හා ඒවායේ සමකාලීන උපයෝගීතාව කෙසේ ද යන්න අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයෙන් සිදු කෙරේ. මෙරට පාලකයන් විසින් පාරසරික සම්පත් කළමනාකරණය කිරීමෙහි ලා හඳුන්වාදෙනු ලැබූ ප්‍රතිපත්ති සහ ක්‍රියාමාර්ග කවරේ ද යන්න මෙහි පර්යේෂණ ගැටලුව වේ. අතීත පාලකයන් මෙරට පාරසරික සම්පත් කළමනාකරණය සඳහා සිදු කළ මැදිහත්වීම හඳුනාගැනීම මෙම පර්යේෂණයේ ප්‍රධාන අරමුණ වන අතර පාරසරික සම්පත්වල තිරසර භාවිතය හඳුනා ගැනීම, පාරිසරික සම්පත් කළමනකරණය කිරීමේ දී අනුගමනිත නීතිමය සීමාවන් හඳුනා ගැනීම ආදිය මෙම පර්යේෂණයේ අනු අරමුණු වේ. ඒ. වී සුරවීර විසින් රචනා කරන ලද අනුරාධපුර සංස්කෘතිය නම් ග්‍රන්ථයේ මෙරට සමාජ ආර්ථික ව්‍යුහය සකස්වීමේ දී පාලකයන් විසින් අනුගමනය කරන ලද ප්‍රතිපත්ති පිළිබඳ සාකච්ඡාවට බඳුන් කර ඇතත් පාරසරික සංරක්ෂණ ප්‍රතිපත්තිවල තිරසර භාවිතය පිළිබඳ අවධානය යොමු කර නැත. එච්.ටී. බස්නායක විසින් රචිත පුරාණ ශ්‍රී ලංකාවේ ජල ශිෂ්ටාචාරය නම් කෘතියේ ද අනුරාධපුර යුගයේ ක්‍රමවත් ජල කළමනාකරණ උපක්‍රම පිළිබඳ සාකච්ඡා කර ඇතත් ඒ පිළිබඳ වූ නෛතික විධිවිධාන කෙරෙහි අවධානවත් සාකච්ඡා වීමක් දක්නට නොලැබුණි. ලලිතා ෆොන්සේකා විසින් රචිත අතීත රජදරුවන්ගේ පරිසර ප්‍රතිපත්ති නම් ග්‍රන්ථයේ මම පර්යේෂණයට අදාළව පරිසර කළමනාකරණය හා සංරක්ෂණය මෙන් ම ස්වාභාවික සම්පත් පරිහරණයේ දී පනවන ලද නියෝග, ජලය, වන සම්පත, වන ජීවීන් වැනි පාරිසරික සම්පත් ආරක්ෂණය පිළිබඳ තොරතුරු හා භූමි කළමනාකරණය ආදී තොරතුරු රාශියක් අන්තර්ගත වී තිබේ. එහි එම ප්‍රත්පත්ති ක්‍රියාත්මක කිරීමේ දී පාලකයන්ගේ මැදිහත්වීම සහ උපක්‍රමික භාවිතාවන් කිරීම පිළිබඳ අවධාරණයෙන් සාකච්ඡා වීමක් සිදු කර නැත. එනිසා මෙම පර්යේෂණ හිඩැස පිරවීම සඳහා උක්ත පර්යේෂණ ලිපිය මගින් සාධාරණයක් ඉටු කිරීම අපේක්ෂා කෙරිණි.

## 02. පර්යේෂණ ක්‍රමවේදය

මෙම අධ්‍යයනයේ දී ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය භාවිත විණි. සාහිත්‍ය මූලාශ්‍රය සහ විශේෂයෙන් ම අභිලේඛන මූලාශ්‍රය මගින් ලබාගත් දත්ත විශ්ලේෂණයේදී (Data Analysis Method) ඓතිහාසික සන්සන්දනාත්මක ක්‍රමවේදය (Historical Comparative Method),තේමා විශ්ලේෂණ ක්‍රමවේදය (Thematic Analysis Method), සිද්ධි අධ්‍යයන ක්‍රමවේදය (Case Study Method),විෂය ප්‍රාමාණිකයන් සමඟ සාකච්ඡාකොට ප්‍රත්‍යක්ෂමූල සාධනය (Empirical Verification Method) වැනි ක්‍රමවේද ඔස්සේ විශ්ලේෂණය කොට නිගමනවලට එළඹීම සිදු කර ඇත.

## 03. ප්‍රතිඵල හා සාකච්ඡාව

### 3.1 ශාක සම්පත ආරක්ෂාවට ගත් පියවර

පරිසර සංරක්ෂණය තුළ ශාක සම්පත් ආරක්ෂාව හා කළමනාකරණය උදෙසා අතීත පාලකයන් ක්‍රියාකළ ආකාරය පිළිබඳ ව විමසා බැලීම කාලෝචිත වේ. ඔවුහු පරිසරය ආරක්ෂා කිරීම සඳහා මෙන්ම මිනිසාගේ පැවැත්ම උදෙසා ද වෘක්ෂලතාවල වටිනාකම හඳුනාගෙන දේශීය කලා ශිල්පයන්ට සමගාමීව ශාක සම්පත හා මිනිසා අතර සමතුලිතතාවක් ගොඩනැගීමට සමත් විය. වනාන්තරය, ශාක හා සතුන් එක් වූ පරිසර පද්ධතියක් ලෙස වැදගත් වේ. මේ හා බැඳුණු සම්පත් හඳුනාගැනීම, ප්‍රයෝජනයට ගැනීම හා අගය කිරීම අතීත අනුරාධපුර රාජ්‍ය පාලන අවධියේ සිට ම පුරුදු පුහුණු වූවකි. ශ්‍රී ලංකාවේ ස්වාභාවික වනාන්තර ඇත අතීතයේ සිට ම රැක බලාගත් අතර නියම අන්දමින් ඉඩම් පරිභෝජනය කිරීමේ දී විශේෂයෙන් ම කෘෂිකර්මය සම්බන්ධයෙන් වනාන්තරවල වැදගත්කම මැනවින් අවබෝධ කරගෙන තිබුණි. වනාන්තරවල පැවැත්මට බාධා පැමිණුණේ අවම වශයෙනි.

වනාන්තරය හා වනාන්තරය තුළ ඇතිවන ජීවීන් ද අතීතයේදීත් වර්තමානයේදීත් මිනිසාට වැදගත් වූ අතර අනාගතයේ දී ද මිනිසාට මූලික අවශ්‍යතා සපුරාගැනීම සඳහා අනිවාර්යයෙන් ම අත්‍යවශ්‍ය වන

සම්පත් වේ. ගල් ගුහාවල ජීවත් වූ මිනිසා ගිනි දැල්වීමට අවශ්‍ය ද මෙන් ම ආහාර සඳහා අල වර්ග, පලතුරු වර්ග ලබා ගත්තේ ද වනාන්තරයෙනි. ඔවුහු ගසක කඳ හාරා සකසා ගත් කොල්ලෑව ප්‍රවාහනය සඳහා යොදාගත්හ. ප්‍රථමයෙන් ම ධාන්‍ය වගා කිරීමට හඳුනාගත් පසු ව පොළව හෑරීම සඳහා යොදාගත් උපකරණය වී ඇත්තේ ද පරිසරයෙන් සොයාගත් ලී දඬු කැබැල්ලකි. එදා මිනිසා ආහාර අතින් ස්වයංපෝෂිත ය. ගෙවත්තේ කෘෂි - වන සංරක්ෂණ කටයුතුවල යෙදී යාබ ද කැලෑ පරිසරය සමඟ ද සාමයෙන් ජීවත් වී ය. මිනිසාත් වනාන්තරයත් අතර කිට්ටු සම්බන්ධතාවයක් පවතී. මිනිසා ඖෂධ ඇතුළු විවිධ ද්‍රව්‍යයන් සඳහා වනාන්තරය මත යැපුණෙකි. මෙම කරුණු අතීතයේ වන සම්පත් හා මිනිසා අතර තිබූ අන්‍යෝන්‍ය සම්බන්ධයේ ස්වරූපය පැහැදිලි කරයි. ස්වාභාවික වෘක්ෂලතා නැවත ඇති කිරිමත් පවත්වාගෙන යෑමත් මත සත්ත්ව සංරක්ෂණය සිදුවන හෙයින් මෙම සම්පත් පිළිබඳ ප්‍රතිපත්ති ගොඩනැගීම ඉතාමත් වැදගත් ය. සෑම වන සතෙකුට ම තමා ලුහුබඳින සතුන්ගෙන් ගැලවීමටත්, අව් වැසිවලින් පැමිණෙන පීඩාවන්ගෙන් බේරීමටත්, සැඟ වී නිදා ගැනීමටත් ආවරණ අවැසි වන්නාක් මෙන්ම සෑම සත්ත්වයෙකුගේ ම ජීවය පවත්වාගෙන යෑම සඳහා ආහාර, ජලය අනිවාර්යයෙන්ම ලබාගැනීමට උපකාරීවන වනාන්තරය පවත්වාගෙන යාම ශාක සංරක්ෂණ ප්‍රතිපත්තියේ ඉතා වැදගත් අංශයක් ද වේ. ඒ අනුව අතීත පාලකයන් මෙම ශාක සම්පත ආරක්ෂා කිරීම හා කළමනාකරණය කිරීම සඳහා නීතිරීති පැන වූ බවට සාක්ෂි හමු වේ. වනාන්තරවල ඇති ගස්වැල් විනාශ කිරීමට ඉඩ නොතබා එම වන සම්පත් සුරැකීම රජුගේ වගකීම බව මෙම නීතිවලින් පෙනී යයි. මෙහි දී රජුගේ පාරසරික සංරක්ෂණ ප්‍රතිපත්ති බලාත්මක බැවින් කිසිවෙකුත් විනාශයන්ට නොපෙළඹෙන අතර නිරායාසයෙන් ම ශාක ආරක්ෂා වේ.

එසේ ම ශාක සම්පතෙහි ආරක්ෂාව සඳහා ආගමික පසුබිම තුළ ද වැඩි අගයක් ලබා දී තිබෙන බව පැහැදිලි වේ. වෘක්ෂලතා ආශ්‍රය කරගෙන විවිධ ජීවීන් ජීවත්වන බැවින් භික්ෂූන් ගහකොළ සිඳීම් නොකළ යුතු බවට විනය නීතියක් ද බුදුදහමේ පනවා තිබේ. සෙවණ ලබා දුන් ගසක අත්තක් බිඳ දැමීම මිත්‍රද්‍රෝහී වීමැක් යැයි භූරිපඤ්ඤ ජාතක පෙළෙහි සඳහන් වේ (ජාතක පාළි 1996: 380). ඒ අනුව ගස්වැල් ආරක්ෂා කිරීම සඳහා නීතිරීති පනවා ඇති බව දැකිය හැකි ය. පරිසරයට හානි පමුණුවා පරිසරය වනසා තමාගේ ප්‍රයෝජන සාහසික ලෙස ලබා නොගත යුතු බව කූටදන්ත සූත්‍රයෙන් පැහැදිලි කර ඇත. "මහාවිජිත රජුගේ මහා යාගයේ දී ගවයෝ නොමරන ලදහ. එළු තිරළුවෝ නොමරන ලදහ. කුකුළෝ හූරෝ නොමරන ලදහ. යාග කණු පිණිස රුක්හු නොසිඳන ලදහ"(දීඝ නිකාය 1996: 274). එසේ ම සංඝරත්නය උදෙසා ප්‍රභූන් පූජාකර ඇති ගල්ලෙන් රාශියක් පිළිබඳ ව ශිලාලිපි සාක්ෂි දරයි. වර්තමානයේ ආරණ්‍ය සේනාසන ආශ්‍රිත ව වන බිම් දක්නට ලැබීමත් එකල භික්ෂූන් වහන්සේලාට පූජා කරන ලද ගල්ලෙන් ආශ්‍රිත ව ද වන බිම් තිබූ බවටත් ඒවා ආරක්ෂා කරගැනීමට නීති පැනවූ බවත්, සඟ සතු දේ මිනිසාගේ අතපෙවීමකින් තොරව ම නිර්මල ව පැවති බවටත් තොරතුරු හමු වේ. අම්පාර උහන ගල්ඔය සෙල්ලිපියෙන් කුබිර නම් තෙරණු කෙනෙකුහට එම වනය පූජා කර ඇති බව දැක් වේ.

"කුබිර තෙරහ වනෙ" (කුවේර තෙරුණ්ගේ වනයයි) (මුදියන්සේ, 2000: 101).

වව්නියාව දිස්ත්‍රික්කයේ මහකච්කට්කෝඩි ශිලා ලේඛනයේ දැක්වෙන පරිදි "බත අභයහ ලෙණ ශගශ"(භර්තෘ අභයගේ ලෙන සංඝයාට) (මුදියන්සේ, 2000: 86). යනුවෙන් ද සිතුල්පව්ව කොරවක්ගල ඇති ශිලා ලිපියක "ගුතහ මහලෙණෙ අගත අනගත චතුදිශ ශගශ"(මුදියන්සේ, 2000: 119). ලෙස දැක් වේ. මෙතුළින් ආගමික වශයෙන් මිනිසුන් තුළ ඇති භක්තිය මෙන් ම ලෙන් ආශ්‍රිත වනය, ගස් වැල් ආරක්ෂාවන බවට ද මේ තොරතුරු ඔස්සේ පැහැදිලි කළ හැකි ය. ශාක සම්පත් ආරක්ෂාව හා කළමනාකරණය පිළිබඳ ව ගත් විට ආගමික සංස්ථාව තුළින් මෙන් ම රාජ්‍ය ප්‍රතිපත්ති තුළ ද ඒ සඳහා පියවර ගෙන ඇති බවට තොරතුරු හමු වේ. ඒ අනුව එම රාජ්‍ය ප්‍රතිපත්ති ගම් මට්ටමේ සිට ම ක්‍රියාත්මක වූ අතර ඒ සඳහා අදාළ අණ පනත් ද ක්‍රියාවට නංවා ඇත. ඒ අනුව ගම වටා පිහිටි වනය, ගම් වාසීන්ගේ පෝෂක ප්‍රදේශය මෙන් ම ශාක සංරක්ෂණය කිරීම අරමුණු කොටගෙන යම් යම් ක්‍රියාමාර්ගයන් ඒ තුළ ගොඩනැගී තිබී ඇත. ගමක් වටා පිහිටි වනය දඩයම් කිරීම, ලී දඬු කපා ගැනීම, දර කැපීම මෙන් ම, මී පැණි ලබා ගැනීම වැනි ජනයාගේ එදානෙදා අවශ්‍යතා සපයා ගැනීම සඳහා භාවිත කරන්නට ඉඩ ලබා දී තිබුණි.

ඉඩමක මායිම් දැක්වීමේ සංකල්පය ද ශාක සංරක්ෂණය සඳහා ඉවහල් වූවකි. කිරිබත්වෙහෙර ටැම් ලිපියේ සඳහන් පරිදි මේගිරි වත්තේන් උතුරු මායිම් ද නැගෙනහිරින් විහාර වත්තෙන් ද දකුණු දිශාවෙන් මී ගසින් ද අවසන් වී ඇත (Epigraphia Zelanica, Vol. I, 1994: 153). මේ අනුව පැහැදිලි වන්නේ එක් ගමකට එක් වන ප්‍රදේශයක් සතු ව ඇති බවත් ගම් වාසීන් එය ආරක්ෂා කර ගැනීමත් තුළින් හා පිට ප්‍රදේශ වාසීන් ඒ බව පිළිගැනීම තුළින් එම වනගත ප්‍රදේශයට අයත් ශාක සම්පත නිතැතින් ම කළමනාකරණය වන බව යි. එමෙන් ම වන සම්පත ආරක්ෂා කර ගැනීම සඳහා රාජ්‍ය ප්‍රතිපත්ති ඔස්සේ කමිටු පත් කර තිබූ බව ද බදුලු ටැම් ලිපියේ දැක් වේ. ඒ අනුව ගමේ වන කොටස ආරක්ෂා කරගැනීම සඳහා අට දෙනෙකුගෙන් යුත් කමිටුවක් පත්කර තිබූ බව දැක්වේ (Epigraphia Zelanica, Vol. V, 1955: 153). වනය සියලු දෙනා ම සතු ස්වාභාවික සම්පතක් ලෙස සලකා එය සංරක්ෂණය කිරීම සඳහා ගම තුළ පුද්ගලයන් වගකීමෙන් ක්‍රියාකළ බව මෙහී දි පැහැදිලි වේ. තව ද රාජ්‍ය ප්‍රතිපත්ති තුළින් ගස් වැල්වල වටිනාකම පැහැදිලි කර දෙමින් ම නීති රීති

ක්‍රියාවට නංවා ඇත. ඒ අනුව මී ගස වැනි ගස්වල ආර්ථිකමය වටිනාකම පැහැදිලි කරන අතර එම ගස් ඉතා ප්‍රයෝජනවත් වන හෙයින් අනවසරයෙන් කැපීම ද තහනම් කර ඇත. මෙලෙස නීති රීති පනවමින් ගස් කැපීම පාලනය කිරීම මගින් ශාක සුරක්ෂා කිරීමට හා කළමනාකරණය කිරීම සඳහා ද පියවර ගෙන තිබේ. ඒ පිළිබඳ ව අනුරාධපුර යුගයේ හමුවන ශිලා ලේඛන රාශියකින් තොරතුරු අනාවරණය වේ. සීගිරි ගලේ වැඩුණු යම් යම් ශාක කැපීම කිසිවකු විසින් හෝ නොකළ යුතු බව ට තහනම් කරමින් පනවන ලද නියෝගයක් මිහින්තලේ පුවරු ලිපියේ සඳහන් වේ.

"ගස් කොළ් නොකැපියැ දියැයුතු මෙ වෙහෙරැ

උාවු තුවාක් ගම් බිම්හි තලන් මීවන් ඈහ්

පලරුැක් කම් නැන් සැ" (Epigraphia Zelanica, Vol. V, 1955: 323).

සීගිරි පර්වතයෙහි හා ඒ අවට වැඩුණු තල් ගස්, පොල් ගස්, මී ගස්, සියඹලා ගස් ආදී වූ මේ ශාක වර්ග කපා හෙළීම සපුරා තහනම් බවද රාජ්‍ය නිලධාරියකු විසින් හෝ එම ගස් විශේෂ කපා දමන ලදුයේ නම් දඩ ගෙවීමකට යටත් වන බව ද එය දඩුවම් ලැබිය යුතු වරදක් බව ද සඳහන් කර තිබේ. එසේ ම V වන කාශ්‍යප රජුගේ අනුරාධපුර පුවරු ලිපියේ ද ගස් වැල් කැපීම සම්බන්ධ නීති රීති පනවා තිබේ.

"ගස් කොළ් නොකපනු ඉසා"(මුදියන්සේ, 2000: 245).

අනුරාධපුර පුවරු ලිපියේ පාරිසරික සංරක්ෂණ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කර ඇති බව හඳුනාගත හැකි ය. "අබහය් ගිරි වෙහෙර්හි ඉසා සෙය් ගිරි වෙහෙර්හි ඉසා බද් තුවාක් ඇත් වෙහෙරැ ගම්බිමට් ඉසා මෙහිමෙ අබැදි තුවක් වෙහෙර්හි ඉසා රජ්මහවෙහෙර්හි ඉසා පිරිවෙන්හි ඉසා පියන්ගල්හි ඉසා මෙහෙණිවර්හි ඉසා සන් සතු පුගුල් සතු ලාභහෙි ඉසා බජ් තුවාන් ගම්බිමට්..........ගස්කොළ් නොකපනු ඉසා......" (කරුණාරත්න 2000:100). මින් පරිසරයේ ඇති වෘක්ෂලතා අනිසි අන්දමින් කපා හැරීම නොකළ යුතු බව දක්වා තිබේ. තව ද කොණ්ඩවට්ටවාන් ටැම් ලිපියේ ද ගස් වැල් සඳහා රටේ පවත්නා නීතියට අනුව දඩ ගන්නවා මිසක වැඩි බදු අය නොකළ යුතු බව දක්වා තිබේ (Epigraphia Zelanica, Vol. V, 1955: 190).

මේ ඔස්සේ රාජ්‍ය නීතිය තුළින් ශාක සම්පත සුරක්ෂා කිරීමට දක්වන ලද අවධානය පැහැදිලි කර ගත හැකි ය. ගස් කැපීම තහනම් කරමින් පනවන ලද නීති අණපනත් බෞද්ධ ආඥාවන් වශයෙන් සඳහන් වීම මඟින් ද රාජ්‍ය ප්‍රතිපත්ති තුළ රාජ්‍ය ආගම පාරිසරික සම්පත් කළමනාකරණය කිරීමෙහි ලා කෙතරම් දුරට උපකාරී වී ඇත්තේ ද යන්න පැහැදිලි වෙයි. ඒ බව IVවන උදය රජුගේ කාලයට අයත් බදුලු ටැම් ලිපියේ සඳහන් ව ඇත (Epigraphia Zelanica, Vo.l V, 1955: 193). ඒ තුළින් බෞද්ධ පන්සල්වලට පවරන ලද ඉඩම්වල ගස් කැපීම තහනම් බව ද එය බෞද්ධ අණක් වන බව ද දක්වා තිබේ. ආගමික ස්ථානවලට පවරනු ලබන වනාන්තරවලින් ලී දඬු හෝ දැව ලෙස කපා නොගත යුතු බව මෙහි දක්වා ඇත.

තව ද ඉඩමේ අයිතිකරුටවත් හෝ ගස් කැපිම තහනම් බව ජේතවනාරාම පුවරු ලිපියේ (Epigraphia Zelanica, Vol. I, 1994: 238) සඳහන් ය. මීට අමතර ව V වන කාශ්‍යප රජුට අයත් ලිපියකට අනුව (Epigraphia Zelanica, Vol. II, 1924: 51-53) ඇත් වෙහෙර, අභයගිරි වෙහෙර හා සඳගිරි වෙහෙරවලට අයත් ඉඩම්වලට රාජකීයන්ට පවා ඇතුළු විය නොහැකි වූ අතර භූමිය වගා කරන්නටත්, රථ, ගොනුන්, මී ගොනුන් සඳහා හෝ ගස් කැපීම ද තහනම් විය. මෙමඟින් වගා කරන ලද ගස් රැක ගැනීම සඳහා රාජ්‍ය ප්‍රතිපත්ති කෙතරම් දුරට ඉවහල් කරගන්නා අන්දමත් මෙන් ම ඒවා සාමාන්‍ය ජනයාට ආදර්ශයෙන් ම ක්‍රියාත්මක කොට පෙන් වූ අන්දමත් මෙන්ම බෞද්ධ සිද්ධස්ථාන පදනම් කරගනිමින් වෘක්ෂලතා ආරක්ෂා කර ගැනීමට සමකාලීන අවධියේ ගත් ක්‍රියාමාර්ගත් මෙයින් පැහැදිලි වේ. මීට අමතර ව ද ගස් වැල් ආරක්ෂා කිරීම සඳහා ගන්නා ලද පියවර ඇතුළත් රාජ්‍ය ප්‍රතිපත්ති සහිත ශිලා ලේඛන අතර ඉතා වැදගත් තැනක් ගන්නා ශිලා ලේඛනයක් ලෙස iv වැනි මිහිඳු රජුට අයත් මිහින්තලා පුවරු ලිපිය ආදී වූ ලිපි වැදගත් තැනක් ගනී. මෙම සෙල්ලිපියන්හි අන්තර්ගතය තුළ වනාන්තර ආරක්ෂා කිරීම සඳහා දැඩි රාජ්‍ය ප්‍රතිපත්තියක් අනුගමනය කර ඇති බව පැහැදිලි වේ. එසේ ම මේ තුළින් වනාන්තරවලට අනවසරයෙන් ඇතුළු වීම පවා නීති විරෝධී ක්‍රියාවක් ලෙස සඳහන් කර තිබේ. එසේ ම පස් වැනි මිහිඳු රජුට අයත් අනුරාධපුර සෙල්ලිපියේ ද වනාන්තර අනවසරයෙන් හෙළි පෙහෙළි කිරීම තහනම් බව දක්වා තිබේ (Epigraphia Zelanica, Vol. I, 1994: 119).

මිහින්තලේ ලිපිය තුළින් දක්වනු ලබන්නේ ගස් පඳුරු කැපීම තහනම් බව පමණක් නොව වනාන්තරයට ද අනවසරයෙන් ඇතුළුවීම තහනම් බව යි (Epigraphia Zelanica, Vol. V, 1955: 323). මේ අනුව විහාරස්ථානයන් වෙතට පවරා දී තිබෙන ඉඩම්වල තල්, මී වැනි දැව සඳහා පාවිච්චි කරන ගස් මෙන් ම තෙල් සිඳීමට ඇට ලබාගන්නා පලතුරු ගස් ද මෙම ඉඩම් සම්බන්ධ ව පත්කර ඇති නිලධාරීන්ගේ අවසර නොමැති ව කැපීම තහනම් බව ද දක්වා තිබේ. තව ද ථූපාරාමය නැගෙනහිර ගල් ඔරුව අසල පිහිටි ලිපිය තුළින් ද භූමියක " පමුණු" ලබා ගන්නා එහි ඇති කැලය නොකැපිය යුතු බවට තොරතුරු අනාවරණය වේ (Epigraphia Zelanica, Vol. I, 1994: 114-119). තව ද මිහින්තලේ ඇති ශිලා ලේඛනයන්හි සඳහන් පරිදි විහාරයට අයත් ඉඩම්වල තල්, මී වැනි ගස් කැපීම තහනම් බව ද මී ශාකය දැව සඳහා ගන්නා ගසක්

බව ද දක්වයි. මී ගස් හා පලතුරු ගස් කැපීමට නොහැකි ලෙස මෙසේ ආඥා පැනවුණු අතර යම් ලෙසකින් එය කිරීමට අත්‍යවශ්‍ය නම් ඒ සඳහා පත් කරන ලද නිලධාරීන්ගේ අනුමැතිය ලබා ගත යුතු බව ද සඳහන් වේ. මේ අනුව රාජ්‍ය ප්‍රතිපත්ති ඔස්සේ නීති ක්‍රියාත්මක කරමින් ක්‍රමානුකූල ව ශාක ආරක්ෂා කිරීමට සහ කළමනාකරණය කිරීමට කටයුතු කර ඇති බව මෙම කරුණු තුළින් අනාවරණය වේ.

අත්තාණී කණු ලේඛනවල ද අනුරාධපුර යුගයේ පුරාතන ලංකාවේ ශාක ආරක්ෂණය පිළිබඳ ව තොරතුරු හමු වේ. පරිසරය සංරක්ෂණය කිරීමේ දී මෙන් ම කළමනාකරණය කිරීමේ දී ශාක ආරක්ෂාව සියලු හරිත රාජ්‍ය ප්‍රතිපත්තීන් අතර වඩාත් වැදගත් ම ක්‍රමවේදය යි. මේ අනුව ශාක සුරක්ෂාව පිළිබඳ ව දැක්වෙන ලද රාජ්‍ය ප්‍රතිපත්තීන් හා අණ පනත් රණාව (Inscriptions of Ceylon" Vol. v, part i, 2004: 98), පුලියන්කුලම (Inscriptions of Ceylon, Vol. v, part i, 2004: 98, 109-112) සහ ඇතාකද (Inscriptions of Ceylon, Vol. v, part ii, 2004: 127-130) වැනි අත්තාණී පරිහාර ලේඛන රාශියක ම තොරතුරු දක්වා තිබේ. ඒ අනුව කැපීමට තහනම් දුර්ලභ, වටිනා, ශාක විශේෂ කිහිපයක් පිළිබඳ ව ඒවායේ සඳහන් කර තිබේ. එසේ නොකැපිය යුතු ගස් අතර පොල් ගස්, මී ගස් (මීවන්) සියඹලා ගස් (සිනිම්බලාන්/*Tamarindus Indica*) ආදී ඵල දරන ශාක හා බෞද්ධයන්ගේ පූජනීය වෘක්ෂ වශයෙන් සැලකෙන දිඹුල් ගස් (ඇසතු *Ficus Religiosa*) වැනි ශාක ප්‍රධාන වේ.

මෙම අණ පනත්වලට සාමාන්‍ය පොදු ජනතාව පමණක් නොව රාජකීයයන් හා රාජ්‍ය නිලධාරීන් ද ගරු කර තිබේ. මේ අනුව කැපීම තහනම් කරන ලද විශේෂිත පල දරන ශාක හා පූජනීය ශාකයන්ට අවධානය හා සැලකිල්ලක් යොමු කෙරුණු අතර කුඩා ශාක, පඳුරු ආදිය නිරපරාදේ විනාශ කර නොදැමූ බව පැහැදිලි වේ. ශාකවලින් ලැබෙන ප්‍රයෝජන මෙන් ම ඒවායේ වටිනාකමත් සහ මිනිස් ජීවිතවලට මෙන් ම අනෙක් සතා සිවුපාවුන්හටත් ශාකවලින් ලැබෙන ප්‍රයෝජන වටහා ගනිමින් පුරාතන ලංකාවේ ශාක ආරක්ෂා කිරීම හා කළමනාකරණය කිරීම සඳහා රාජ්‍ය ප්‍රතිපත්ති ඔස්සේ කටයුතු සම්පාදනය කර ඇත. මේ අනුව නීති අණපනත්වලින් හෝ වටිනා ශාක එදා සිට අද දක්වා ම නොනැසී පැවතීමටත් මෙම ක්‍රියාවලීන් හේතු වී ඇති බව කිව හැකි ය.

එසේ මී, කුඹුක් වැනි විශාල ශාක ආරක්ෂා කිරීම තුළින් ඉතා වියළි කලාපයක් තුළ පවතින ජල හිඟය හා භූගත ජල සම්පත් ආරක්ෂා කිරීමට හැකිවන බව අතීත මුතුන් මිත්තන් අවබෝධයෙන් දැනසිටි අතර මෙම අණපනත් නොතිබුත් අනුරාධපුර යුගය තුළ සමකාලීන පුරවැසියා තම ජීවන අවශ්‍යතා වනාන්තරය ආශ්‍රයෙන් ප්‍රමාණවත් ලෙස පමණක් ලබා ගනිමින් ඒවා අනාගතය උදෙසා ආරක්ෂා කරන්න ට කටයුතු කර ඇතැයි සිතිය හැකි ය.

## 3.2 සත්ත්ව හා ජල සම්පත් සුරක්ෂාව

බෞද්ධයකු වීමේ මූලික සුදුසුකම වන්නේ පංචශීලය රැකීම යි. පංචශීලයේ මුල ම ශික්ෂාපදය වන්නේ ප්‍රාණඝාතය නොකිරීම යි. ජීවීන් සුරැකීමේ ඉතා ප්‍රබල පදනමක් මේ ඔස්සේ වැටී තිබේ. බෞද්ධ දර්ශනය පදනම් කරගනිමින් මෙරට වූ බහුතර රාජ්‍ය ප්‍රතිපත්ති සකස් වූ බව පිළිගැනීමයි. ඒ අනුව පාරිසරික සම්පත් සුරැකීමේ ප්‍රතිපත්ති ද බෞද්ධාගමික කරුණු පදනම් කරගනිමින් බිහි වී ඇත. එසේ නම් පංචශීල ප්‍රතිපත්තිය නිසැක වශයෙන් ම රාජ්‍ය ප්‍රතිපත්ති සකස් කිරීමේ දී භාවිතය ට ගත් අතර පුරාතන ලංකාවේ තිබූ දඩයම් සමාජයෙන් ඈත් වීමට එය විශාල රුකුළත් වූ බව ද කිව හැකි ය. ඒ අනුව පුරාතන ලංකාවේ පරිසර සම්පත් අතර ඉතා වැදගත් ස්ථානයක් හිමිවන සත්ත්ව සුරක්ෂාව/වනජීවී සුරක්ෂාව පිළිබඳ ව වැඩි අවධානයක් බෞද්ධාගමික පදනම මත යොමු වී තිබූ බවට මනා ව සාක්ෂි හමු වේ.

බෞද්ධයන් ප්‍රාණඝාත සිල් පදය ආරක්ෂා කළයුතු වූ අතර එහි දී ගොඩබිම හා ජලය ආශ්‍රිතව වෙසෙන සියලු සතුන්ගේ ජීවිත ආරක්ෂා කිරීම පාලකයා සතු වගකීමක් හා යුතුකමක් වූ බව හඳුනාගත හැකි ය. ඒ අනුව අතීත පාලකයන් සත්ත්ව සුරක්ෂාව හා කළමනාකරණය කිරීම සඳහා විවිධ ක්‍රියාමාර්ග අනුගමනය කර ඇත. ඒ අතර විවිධ අණ පනත් පැනවීම මෙන් ම අභයදාන සංකල්පය වැනි විවිධ සංකල්පයන් ඔස්සේ ද සියලු සත්ත්වයන්හට ද වටිනාකමක් ලබා දී තිබෙන බවට පැහැදිලි වේ. වනාන්තරයක ගස් වැල් හා ජීවීන් සම්පත් දෙකක් නොව එකක් වශයෙන් සැලකුණු අතර වන සතුන් වනාන්තරයෙන් වෙන් කර සැලකිය නොහැකි විය. මෙම කොටස් දෙක ම එක් වී පාරිසරික ජෛව විවිධත්වය නිර්මාණය වී ඇති අතර එම සියලු ජීවිත ආරක්ෂා කරමින් කළමනාකරණය කිරීම වැදගත් විය. සත්ත්ව ආරක්ෂාව හා කළමනාකරණය පිලිබඳ ව අධ්‍යයනය කරන විට ජීවීන් යනු ගෘහස්ත නොවූ ජීවීන් ය (ෆොන්සේකා 2006: 150). මෙයට ගොඩබිම මෙන් ම ජලජ ජීවීන් ද ඇතුළත් කළ හැකිය. වර්තමානයේ දී වන ජීවීන් යන වචනය පිළිබඳ ව පුළුල් අර්ථයක් සහිත ව ඉදිරිපත් කළ ද ජීවීන් හෝ සතුන් ගත් විට සියලුම ක්ෂීරපායින්, පක්ෂීන්, මත්ස්‍යයින් ආදී ගොඩබිම, ජලාශ්‍රිත සියලු ම ජීවීන් සත්ත්වයින් ලෙස ගත හැකි ය.

සත්ත්වයින්ගේ මනා පැවැත්ම සඳහා සත්ත්ව සංරක්ෂණය, වනාන්තර ඇතුළු ජීවීන් නිසි පරිදි පවත්වාගෙන යාම හා ජීවී ගහණ සංරක්ෂණය කරමින් නොනැසී පවත්වාගෙන යාම ආදිය සත්ත්ව කළමනාකරණ ක්‍රියාමාර්ග ඉවහල් වේ. ශ්‍රී ලංකාවට බුදුදහම හඳුන්වාදුන් අවස්ථාවේ ප්‍රථම ධර්ම දේශනය පැවැත් වූයේ මඟුල් ඇත් හලෙහි යැයි සාහිත්‍ය මූලාශ්‍රයවල සඳහන් වන අතර එමඟින් සතුන් හා මිනිසුන් අතර ඇති සමීප බැඳීම පෙන්වා දී ඇත. ඒ අනුව එකල පටන් ම පුරාතන ලංකාවේ සත්ත්ව සුරක්ෂාව සඳහා කටයුතු කෙරී ඇති බව පෙනී යයි.

සතුන්ගේ ආරක්ෂාව ක්‍රම දෙකක් යටතේ තහවුරු කළ හැකි වේ. එනම්, සතුන් ඇල්ලීම හා තුවාල සිදු කිරීම, මැරීම තහනම් කිරීම මඟින් ආරක්ෂා කිරීම හා සතුන් වැඩි වශයෙන් ගැවසෙන කාලවල දී ඝාතනය කිරීම, ඇල්ලීම හෝ තුවාල සිදු කිරීම තහනම් කිරීමයි. එසේ ම සත්ත්ව සංරක්ෂණය විවිධ උපක්‍රමශීලී ක්‍රමවේද ඔස්සේ කළ හැකි බව ද දැක්වේ (ෆොන්සේකා 2006: 158). එනම්, ස්වාභාවික වනාන්තරවලින් හා වෙනත් වන සත්ත්ව වාසස්ථාන සෑහෙන ප්‍රමාණයක් සම්පූර්ණයෙන් ම වන සතුන් සඳහා වෙන් කිරීම, වඳ වී යන හා එවැනි තර්ජනවලට ගොදුරු විය හැකි ශාක හා සත්ත්ව විශේෂයන්ට ආරක්ෂාව සැලසීම සඳහා දැඩි නීතිරීති ක්‍රියාත්මක කිරීමත් ය.

මෙම ක්‍රියාමාර්ග රඳා පවතින්නේ සත්ත්වයින් සඳහා යොමු වී ඇති අනතුරු හා බලපෑම් හඳුනා ගැනීම මත ය. බොහෝ ජීවීන් රැක ගැනීම කළ හැක්කේ ඔවුන්ගේ පරිසරය තුළ අවශ්‍ය ආහාර, ජලය හා වාසස්ථාන සැපයීම මඟිනි. කෙසේ වෙතත් ජීවීන් විශාල ලෙස අනතුරට භාජනය වී ඇත්තේ මිනිසාගේ ක්‍රියාකලාපයන් හේතුවෙනි. ඒ අනුව මෙම වන සතුන් හා ඔවුන්ගේ වාසස්ථාන ආරක්ෂා කිරීම සඳහා මානව පරිසර දූෂණ ක්‍රියාකාරකම් පාලනය කළයුතු වන අතර සත්ත්ව භූමි ප්‍රදේශ මිනිසාගේ බලපෑමෙන් තොර ව ආරක්ෂිත ව තැබිය යුතු වේ. අතීතයේ ශ්‍රී ලංකාවේ රාජ්‍ය ප්‍රතිපත්ති තුළ මෙම කරුණු දෙක ම පිළිබඳ ව දැඩි සේ අවධානය යොමු කර ඇති අතර සමකාලීන සමාජය තුළ එසේ කිරීමට දැඩි අවශ්‍යතාවක් පැන නැඟී තිබු බව ද සිතිය හැකි ය. දඩයම් කිරීම මඟින් ජීවීන්ට වන තර්ජනය, වන සතුන් මැරීම ආදීය තහනම් කිරීම සඳහා නීතිරීති හා රෙගුලාසි පැනවීම මඟින් පාලනය කර සංරක්ෂණය කරගත හැකි වේ. එසේ ම මෙම නීතී තුළින් කුමන අවස්ථාවක මෙම සතුන් දඩයම් කළ හැකි ද, කොපමණ ප්‍රමාණයක් දඩයම් කළ හැකි ද වැනි කරුණු පිළිබඳව ද අවධානය යොමු කළ යුතු වේ.

මේ අනුව අනුරාධපුර රාජධානි අවධියේ ලියවුණු අභිලේඛන කීපයක ම පාහේ මෙවන් සත්ත්ව ආරක්ෂණය පිළිබඳ ව අණපනත් දැක්වෙන අතර ගිරිතලේ ගල් ආසන ලිපියේ දැක්වෙන පරිදි විශාල ජලාශවල හා කැලෑවෙහි ජීවත් වන සතුන්ට බියකින් තොරව ජීවත්වීමේ නිදහස ලබා දුන් බව කියවේ (Epigraphia Zelanica, Vol. V, 1955: 439). මෙතුළින් මිනිසාගේ මෙන් ම සතුන්ගේ ජීවිතවල ද වටිනාකම එකල දී තහවුරු කර ඇති බවක් දක්නට ලැබේ. බුද්ධදාස රජු සමස්ත දිවයින පුරා ගම් දහසකට එක් වෛද්‍යවරයෙකු බැගින් පත් කර, ගමක් පසා ආරෝග්‍යශාලා ඉදිකරන ලද බව සඳහන් වේ (මහාවංසය 1996: 37 පරි: 5 ගාථාව). තව ද ක්‍රි. ව. 853 පමණ කාලයට අයත් දෙවැනි සේන රජුට අයත් බසවක්කුලම ටැම් ලිපියේ ද (Epigraphia Zelanica, Vol. II, 1924: 401) අභය වැවේ මසුන් ඇල්ලීම හා සම්බන්ධ ව්‍යවස්ථාවන් ප්‍රකාශයට පත් කර තිබේ. එසේ ම තුන්වැනි උදය රජුගේ සොරබොර වැව ටැම් ලිපියේ ද (Epigraphia Zelanica, Vol. II, 1994: 71) මෙවැනි ම මසුන් මැරීම සම්බන්ධ නිති අණ පනත් සඳහන් කර තිබේ. මීට අමතර ව දෙවැනි උදය රජුගේ (ක්‍රි. ව. 897-898) ගිරිතලේ පුවරු ලිපියේ ද (Epigraphia Zelanica, Vol. II, 1924: 80) උභය මසුන් මැරීම පිළිබඳ ව තොරතුරු දක්වා තිබේ. එසේ ම අභිලේඛන කීපයක ම "ශාප පාඨ" වශයෙන් ද මසුන් මැරීමේ පාපයන් පිළිබඳ ව සඳහන් කර තිබේ. කිතිසිරිමෙවන් රජුගේ කැලණි ලිපියේ (Epigraphia Zelanica, Vol., II 1924: 190) "හිඟුලේ විහාර දාන පත්‍රය එතෙර කරුවේ මසුන් මැරූ පව් ගත්තාහ" යනුවෙන් ද සඳහන් කර තිබේ. ඒ අනුව මෙහි දී මසුන් මැරීම පාපයක් ලෙස දක්වමින් සත්ත්ව සුරක්ෂාව සඳහා පියවර ගෙන තිබේ.

මේ අනුව මෙම කාලයේ පුරාතන ලංකාවේ රචිත ශිලා ලේඛනවල මසුන් සඳහා වූ මාඝාත ආඥා සම්බන්ධ ව සඳහන් කරමින් ලිපි කිහිපයකින් ම මත්ස්‍යය සුරක්ෂාව සඳහා කටයුතු සම්පාදනය කර තිබේ. ක්‍රි. ව. 19 පමණ කාලයේ දී ආමණ්ඩ ගාමිණී රජු විසින් ද නිතී පනවමින් 'සතුන් නොමැරිය යුතු ය' යනුවෙන් පනවන ලද ආඥාවන් දක්නට ලැබුනේ ද මෙම අවධියේ දී ය (අධිකාරම්, 2013: 188). ඒ අනුව ගොඩබිම වෙසෙන සත්ත්වයින් පමණක් නොව ජලයේ වෙසෙන සතුන්ගේ ද ජීවිත සුරක්ෂාව පිළිබඳ ව අතීත පාලකයන් කටයුතු කර ඇති බව පැහැදිලි වේ. මීට අමතර ව සතුන් මැරීම වරදක් ලෙස දක්වමින් ඒ සඳහා දැඩි දඬුවම් පනවමින් නිකුත් කරන ලද රාජ්‍ය අණ සඳහන් ශිලා ලේඛන කිහිපයක් ද අනුරාධපුර යුගයේ දී හඳුනාගත හැකි ය. ඒ අතර ප්‍රධාන ලෙස ම ගත හැක්කේ හතරවැනි මිහිඳු රජු විසින් රචිත (ක්‍රි. ව. 956-972) වේවැල්කැටිය පුවරු ලිපිය යි. මෙහි රාජ්‍ය නිතිය මඟින් පාලනය කිරීමක ට අමතර ව සත්ත්ව ඝාතනය සම්ප්‍රදායානුකූල ව ම අයහපත් පහත් ක්‍රියාවක් ලෙස සමාජය තුළ පිලිගත් බැවින් එම වරද කරන්නා සමාජය තුළින් ම පුනරුත්ථාපනය කිරීමක් කරනු ලැබේ. එකල සමාජය තුළ ජීවත් වූ පුද්ගලයන් ගව මස් ආහාරය පිණිස ගත් බව ට කිසිදු සාධකයක් නොමැත.

සමාජය විසින් ගව මස් කෑම පිළිකුල් කරන ලද බව ද ගවයින් මැරීමත්, ගව මස් කෑමත් දඬුවම් ලැබිය යුතු වරදක් සේ පිළිගත් බවට ද සාධක ඇත. ගව මස් කෑම දඬුවමක් ලෙස සලකා පහත් කුලවලට අනුගත කිරීමේ ක්‍රියාවක් පැවතුණු බව කියවෙන අතර සතුන්ගේ හම් වාඩි වීම සඳහා භාවිත නොකළ යුතු යැයි ද අදහසක් වී ය (සුරවීර, 1959: 105). ශිලා ලේඛන පිරික්සීමේ දී කිරි එළදෙනුන්, ගොනුන් හා මී හරකුන් වශයෙන් ගව වර්ග තුනක් ගැන කියැ වේ. මෙම සතුන් මිනිසාට මහත් සේ ප්‍රයෝජනවත් බැවින් ඔවුන්ට හිංසා කිරීම හා මැරීම නොකළ යුතු බව ආඥා පනවමින් දක්වා තිබේ. එකල එසේ පැවති නිතීන් වේවැල්කැටිය සෙල්ලිපිය (අමරවංශ, 1969: 286) තුළ මනාව දක්වා තිබේ. ඒ අනුව මී හරක් හා එළුවන් මැරුවන් සඳහා මරණ දණ්ඩනය ලබා

දියයුතු බවත්, ඔවුන් නොමරා සොරකම් කරගෙන ගියහොත් එම සොරුන් නියත වශයෙන් හැඳිනගෙන ඔවුන්ගේ කිහිලිවල හණ ගසා පිටුවහල් කළයුතු වූ බවත් මෙම ලිපියේ දැක් වේ. මේ අනුව මිනිසාගේ මෙන් ම සත්ත්වයන්ගේ ද අයිතිවාසිකම් සුරක්ෂා කිරීමක් ද අතීත පාලකයා විසින් සිදුකරන ලදී. මීට අමතර ව 10 වැනි සියවසට අයත් කර්තෘ අඥාත අනුරාධපුර ගල් ඔරුවේ සන්නසක් (අමරවංශ, 1969: 280) තුළින් ද එළුවන් මැරීම වරදක් ලෙස දක්වා ඇත. ඒ බව මෙලෙස දැක්විය හැකිය.

"හවුතියේ එළු මැරුවා ක....."

තව ද තිඹිරිවැව ශිලා ලේඛනයේ ද (Epigraphia Zelanica, Vol. II, 1924: 13) කිරි ගවයින් හා මී ගවයන් මැරීම තහනම් කර තිබෙන්නේ මෙසේ ය.

"කිරි ගෙරි ගැල් මීවුන් නොගන්නා ඉසා"

එලෙසින් ම කිරි ගවයින් හා ගොනුන් මැරීම තහනම් බව ඇටවීරගොල්ලෑව ලිපියේ ද (Epigraphia Zelanica, Vol. II, 1924: 46) සඳහන් කර තිබේ.

"කිරි ගෙරි ගම් ගොන් නොගන්නා ඉසා"

මෙම කරුණු මඟින් සනාථ වන්නේ කෘෂි අර්ථ ක්‍රමය සඳහා යොදා ගන්නා ලද සතුන් වශයෙන් මොවුන් ආරක්ෂා කරන ලද බව යි. එසේ ම රටේ ආර්ථික ප්‍රතිපත්තිය සත්ත්ව සංරක්ෂණ ප්‍රතිපත්තියට ද නැඹුරු ව ක්‍රියාත්මක වූ අයුරු ද මෙමඟින් පැහැදිලි වේ. තව ද මෙවැනි අපරාධ කරන්නවුන්ට දඬුවම් දීම සඳහා ඉතා පැහැදිලි නීතී ක්‍රමයක් දසගම් ක්‍රමය (Epigraphia Zelanica, Vol. III, 1994: 190) යටතේ ද ක්‍රියාත්මක වීය.

මෙම නීතී රීති බොහෝමයක් බෞද්ධ ආගමික බලපෑම මත රාජ්‍ය ප්‍රතිපත්ති සකස් කිරීමේ දී එක් කළ බව ද මෙතුළින් පැහැදිලි කළ හැකි වේ. එසේ ම මෙම කරුණු මඟින් පැරණි ශ්‍රී ලංකාවේ අනුරාධපුර යුගයේ දී රාජ්‍ය ප්‍රතිපත්ති තුළ පැහැදිලි සත්ත්ව සංරක්ෂණ ක්‍රියාමාර්ගයන් අනුගමනය කර ඇති බවට පැහැදිලි ය. සතුන්ට හිංසා කිරීම, මැරීම මරණීය දණ්ඩනය හිමි වියයුතු ක්‍රියාවන් බව ද මෙම නීතී තුළින් පෙන්වා දේ. එසේ ම සතුන්ට ජීවත් වීමට අවශ්‍ය කරන වනාන්තර වාසස්ථාන ගම් මට්ටමින් ඇති කළ යුතු බවට සෙල්ලිපි ආශ්‍රයෙන් පැහැදිලි කෙරේ.

තව ද බුද්ධදාස රජුගේ (ක්‍රි. ව. 365-406) රාජ්‍ය කාලයේ දී පශු වෛද්‍ය ක්‍රමයන් බොහෝ දියුණු මට්ටමින් පවත්වාගෙන ගිය බවට ද සාධක හමු වී ඇත. ඔහු විසින් සතුන් වෙනුවෙන් ශෛල්‍ය කර්ම පවා කරන ලද බව කියවෙන අතර, තව ද මිහින්තලය ආශ්‍රය කරගෙන අනුරාධපුර යුගය වන විට අභයභූමි සංකල්පයක් ද ගොඩනැඟී තිබුණි. මේ අනුව අනුරාධපුර යුගය තුළ සත්ත්ව සුරක්ෂාව හා කළමනාකාරණය මනා ලෙස සිදු කර ඇති බව පැහැදිලි වේ.

පුරාතන ලංකාවේ රාජ්‍ය ප්‍රතිපත්ති අතර පරිසර ප්‍රතිපත්ති සැකසීමේ දී ජල සම්පත් පාලනය සඳහා වැඩි අවධානයක් යොමු ව තිබිණි. ස්වාභාවික සම්පත් අතර සීමිත සම්පතක් හා අලුත් කළ හැකි එසේ ම නැවත පරිහරණය කිරීමට හැකි සම්පතක් වශයෙන් සැලකෙන ජලය ක්‍රමවත් පාලනයක් තුළින් දිගුකාලීන ව ප්‍රයෝජනයට ගත හැකි ය. පැරණි ශ්‍රී ලංකාවේ ආර්ථිකය සම්පූර්ණයෙන් ම කෘෂිකර්මාන්තය මත පදනම් කරගත් හෙයින් ආර්ථික ස්ථාවරත්වය සඳහා කෘෂිකාර්මික නිෂ්පාදන පුළුල් කිරීමට සැලසුම් සහගත ලෙස ජලය පරිභෝජනය කිරීම අවශ්‍ය වේ. ශ්‍රී ලංකාවට පැමිණි ආර්ය ජනතාව රජරට ප්‍රදේශයේ ස්වාභාවිකව ම පවතින වියළි දේශගුණයක් සහිත තැනිතලා බිම්වල ජලය පදනම් කොට ගනිමින් ආර්ථික ශක්තිය ගොඩනැඟීමට අවශ්‍ය පසුබිම සකස් කරගත්හ. එසේ පසුබිම සකස් කර ගැනීම සඳහා ගන්නා ලද ක්‍රියාමාර්ගයන් ජල කළමනාකරණය ලෙසින් හඳුනාගත හැකි ය. එය එකල ජනතාව තුළ තිබූ මහඟු හැකියාවක් වන අතර ජල කළමනාකරණ සැලැස්ම තුළ භූමි පරිභෝග සහ පාංශු සංරක්ෂණ සැලැස්මක් ද අන්තර්ගත වන බව පැහැදිලි වේ.

ඓතිහාසික තොරතුරුවලට අනුව ශ්‍රී ලංකාව තුළ පුරාතනයේ දී විශේෂයෙන් ම මෙහි දී අවධානය යොමු කරනු ලබන අනුරාධපුර යුගයේ දී ජල සුරක්ෂාව හා කලමනාකරණය සඳහා ගත් පියවරක් ලෙස වාරි වාරිමාර්ග, වාරි තාක්ෂණ සංකල්පය මහත් සේ ප්‍රයෝජනවත් විය. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් ස්වභාවයෙන් ම වියළි කලාපයන් තුළ කෘෂි කටයුතු සඳහා අවශ්‍ය ජලය රැස්කර තබා ගැනීම සඳහා වාරිමාර්ග, වාරි පද්ධති සකස් කෙරිණි. ඒ අනුව නිර්මාණය කරන ලද වැව් මඟින් ජලය රැස්කර එම ජලය ගුරුත්ව බලය ආධාරයෙන් කුඹුරුවලට ගෙනයාමේ මූලධර්මය යටතේ ඇළ පද්ධති ක්‍රමයක් මත ගොඩනැඟී තිබුණ බව පැහැදිලි කරුණකි. සමකාලීන ආර්ථිකය ප්‍රධාන වශයෙන් ම රඳා පවතින්නේ ජලය පරිහරණය කිරීමේ දී හැකිතරම් දුරට පිරිමැසුම්දායී ව හා මනා පාලනයකින් යුක්ත ව පවත්වාගෙන යාම මඟින් බව එකල ජනයා වටහා ගෙන සිටි අතර ඔවුන් කිසිදු විටෙක වැවක ජල ධාරිතාව උපරිමය ඉක්මවා වාන් දමා, එම වැඩි ජල කොටස් අපතේ යාමට ඉඩ නොදුන්හ.

මේ අනුව ජලය අවශ්‍ය විටෙක ප්‍රයෝජනයට ගැනීම සඳහා ගබඩා කිරීමටත්, ජලය බෙදා හැරීමේ දී සිදුවන නාස්තිය වැළැක්වීමටත් මනා කළමනාකරණයක් පවත්වා ගැනීමට අදාළ නීතිරීති මෙන් ම ජලය නාස්ති කිරීමකින් තොර ව උපරිම ලෙස ප්‍රයෝජනයට ගැනීමට අවශ්‍ය විවිධ වූ විධික්‍රම වැඩිදියුණු කිරීමට ද අවධානය යොමුකර තිබේ. එසේ ම ජනසංඛ්‍යාව වර්ධනයත් සමඟ විශාල වන කෘෂිකාර්මික ක්‍රියාවලිය සමඟ එක් වූ ජල පාලන විධිවල ආරම්භයේ හා විකාසනයේ විවිධ අවස්ථා ද

දක්නට ලැබේ. මේ නිසාවෙන් ජලය රැස්කිරීම හා ක්‍රමවත් කළමනාකරණයක් යටතේ ජලය පරිහරණය කිරීම මෙම යුගයේ පැවති දේශගුණික තත්ත්වය යටතේ අනිවාර්ය අංගයක් විය. මේ පිළිබඳ ව අනුරාධපුර යුගයට අයත් ශිලා ලේඛන රාශියක ම තොරතුරු අන්තර්ගත වන අතර ඒ පිළිබඳ ව විග්‍රහ කිරීම සිදු කළ යුතු වේ.

ක්‍රි. ව. 4වැනි සියවසේ පමණ සිට අනුරාධපුර යුගයේ අවසානය දක්වා වූ කාල වකවානුවේ දී ලියන ලද ඇතැම් ශිලා ලේඛන රාශියක ම පාහේ වාරිමාර්ග ක්‍රමවල ස්වරූපය, ඒවායේ නඩත්තුව හා වාරි නිතී, වාරි මාර්ග නිලධාරීන් මෙන් ම වාරි තාක්ෂණය පිළිබඳ ද කරුණු අනාවරණය කරයි. රටේ එකල වාරි මාර්ග පද්ධතියේ දියුණුව සහ එහි ප්‍රතිපලයක් වශයෙන් ඊට සමගාමී ව ඇති වූ කෘෂිකාර්මික දියුණුවත් සමඟ විහාරාරාම ආදියට ලබා දුන් ප්‍රදානයන් ප්‍රමාණය ද ඉහළ යාම දක්නට ලැබිණි. මේ අනුව කෘෂිකාර්මික ක්ෂේත්‍රයට සම්බන්ධ වාරි තාක්ෂණයේ දියුණුව කුඩා ගම් වැව් මඟින් ආරම්භ විය. ඉන්පසු ක්‍රි. ව. පළමුවැනි සියවසෙන් පසු අනුරාධපුර යුගය ආරම්භයත් සමඟ කුඩා වැව් වෙනුවට මහ වැව් නිර්මාණය කිරීම ආරම්භ වූ බව ශිලා ලේඛන තුළින් පැහැදිලි වේ. කෘෂිකර්මාන්තය සහිත සමාජයක ගම් නිර්මාණය වුයේ වැවක් මුල් කරගෙන ය. එය සනාථ වන ශිලාලේඛන රාශියකි. කොතලකිඹියාව ලිපියෙන් "දකබරි" ගමේ වැව යනුවෙන් ද, කයිකාවල ගිරි ලිපියෙන් වනකඩගම වැව පිළිබඳ ව ද ආදි ලෙස කුඩා ගම් වැව් පිලිබඳ තොරතුරු හමු වේ. මීට අමතතර ව විශාල වැව් රාශියක් පිළිබඳ ව ද සෙල්ලිපි ආශ්‍රයෙන් තොරතුරු හෙළි වේ (බණ්ඩාර, 2008: 50).

ඒ අනුව තෝරමයිලෑව ලිපියෙන් පුණපිටක වැව ද, විහාරේගල ලිපියෙන් 'උපලදොනික' නම් වැවක් ගැන ද, එසේ ම මිහින්තලේ ගිරිලිපියේ මහාදායික මහානාග රජු විසින්ම ගණේකන්ද විහාර ලිපියෙහි 'නවලක හත පය කමරේ දිනයේ අවරණ හරිතන ගම තරපය' ගමෙහි සමෘද්ධිය සඳහා වේල්ලක් ඉදිකිරීමට නව ලක්ෂයක් කම්කරුවන් අත් අත්පා මෙහෙවරට දුන් බව මින් කියවේ. මින් අපට හැඟෙනුයේ ඒ ඒ ගම්වල සමෘද්ධිය පතා අතීත පාලකයන් වැව් ඉදිකර කෘෂිකර්මාන්තය දියුණු කිරීමට මැදිහත් වූ බව යි. වැව් රාශියක් විහාරයට පූජා කළ බවත්, මීට අමතර ව දොරබාවිල හා ගොන්නෑව ටැම් ලිපිවල යෝධ වැව, මහකනදරාව, නුවරවැව, නාච්චදූව, කලාවැව, පදවිය, කන්තලේ, කවුඩුල්ල වැනි විශාල වැව් පිලිබඳව ද තොරතුරු රාශියක් හෙළිදරව් වේ. එසේ ම විවිධ රජවරුන් විසින් කරවන ලද වැව් හා වාරි මාර්ග පිළිබඳ ව ද සෙල්ලිපි තුළ තොරතුරු අන්තර්ගත වේ. ශිලා ලේඛන රාශියක ම වැව් හිමියන් පිළිබඳ සදහන් වේ. සැස්සේරුව ශිලා ලේඛනයෙහි "සිද්ධම් යවවමික වවිහමික චූල හුමනහ ලෙණෙ උපසික හුමය.....සගය නියතෙ" නම් චුල්ල සුමනගේ ලෙණ යන්නයි (Inscriptions of Ceylon, Vol. 1, 1970: 98). එමෙන් ම ගණේකන්ද විහාර ලිපියෙහි "නවලක හත පය කමරේ දිනයේ අවරණ හරිතන ගමතරපය..." (Inscriptions of Ceylon, Vol. 1: 1970 97). ගමෙහි සමෘද්ධිය සඳහා වේල්ලක් ඉදිකිරීමට නව ලක්ෂයක් කම්කරුවන් අත් අත්පා මෙහෙවරට දුන් බව මින් කියවේ. මින් අපට හැඟෙනුයේ ඒ ඒ ගම්වල සමෘද්ධිය පතා අතීත පාලකයන් වැව් ඉදිකර කෘෂිකර්මාන්තය දියුණු කිරීමට මැදිහත් වූ බවයි. වියළි කලාපයේ බිහි වූ වාරි පද්ධතියේ සුවිශේෂී අංගයක් ලෙස ඇළ මාර්ග දැක්විය හැකි ය. වැවකින් මුදා හරින ලද ජලය කෘෂි බිම් වෙත මෙන් ම එතුළින් මුදා හරින ජලය නැවත වැවකට හෝ ගංගාවකට මුදා හරින්නේ ඇළ මාර්ග හරහා ය. ශිලා ලේඛනවල "අඩි" යනුවෙන් ඇළ මාර්ග හඳුන්වා ඇති අතර කුඨකණ්න තිස්ස රජුගේ අබය හා නක රජු සීහ පබ්බත විහාරයට ඇළ මාර්ග දෙකක් ප්‍රදානය කළ බව දැක්වේ. එසේ ම යකසහව, වඩක හා හමනකර යන ඇළ මාර්ග පිළිබඳ ව ද, මිහින්තලේ ගිරි ලිපියේ හා මින්විල ගිරි ලිපියේ ද "රජ ඇළ" පිළිබඳ ව වූ සටහනින් ද පුරාතන ලංකාවේ වැව්වල ට අමතර ව පැවති වාරි මාර්ග පද්ධතියක් වශයෙන් ඇළ මාර්ග පැවති බවට තොරතුරු හෙළි වේ (බණ්ඩාර, 2008: 55).

තව ද ගංගා, ඇළ මාර්ග ආදීයේ ජල මට්ටම පාලනය කිරීම සඳහා ඒ හරහා බඳිනු ලබන බැම්ම අමුණ නමින් හැඳින්විය හැකිය. අමුණක ප්‍රධාන කාර්යය වන්නේ ජලය හැරවීම යි. ඇතැම් විට අමුණේ ජලය කෘෂි බිම් වෙත හෝ වැව් සඳහා යොමු කෙරිණි. ඒ අනුව අමුණ ජල කළමනාකරණය සඳහා යොදාගත් ප්‍රධාන අවස්ථාවක් ලෙස ද හඳුනාගත හැකි වේ. ශිලා ලේඛන තුළ අමුණ "අවරණ" ලෙස හඳුන්වා ඇති අතර ගණේකන්ද විහාර ලිපිය, ජේතවනාරාම ලිපිය ආදියේ අමුණු පිළිබඳ ව සඳහන් ව තිබේ (බණ්ඩාර 2008: 56). මුල් කාලයේ කුඩා වැව් නිර්මාණයත් සමඟ ඇරඹි වාරි පද්ධතිය මහවැව් දක්වා විකාශනය වීමේ දී වාරිමාර්ගවල තාක්ෂණය ද ඒ හා සමාන ව ම වර්ධනය විය. වැවක සතු ප්‍රධාන කාර්යය ජලය රැස්කර තබා ගැනීමවන අතර එහි ජලය මනා පාලනයකින් යුතු ව මුදා හැරීම සඳහා විවිධ තාක්ෂණික අංග වාරි නිර්මාණයේ දී යොදාගෙන තිබෙන බව ශිලා ලේඛන ඔස්සේ පැහැදිලි කරයි. ඒ අනුව සොරාව්ව, බිසෝකොටුව, පිටවාන ඇතුළු වූ විවිධ තාක්ෂණික අංග රැසක් පිළිබඳ ව තොරතුරු හෙළිකරනු ලබයි. මීට අමතරව වාරි මාර්ග හා සම්බන්ධ නිලධාරීන් පිළිබඳ ව ද ශිලාලේඛනවල තොරතුරු සඳහන් වේ. ඒ අනුව පෞද්ගලික වැව් හිමියන් "වපිහමික, වවිහමික" ආදී නම්වලින් හඳුන්වා දී ඇත. ඇතැම් අවස්ථාවල වැව හිමිකරුවාගේ නාමයෙන් හඳුන්වා ඇත. ඔවුන් වාරි කටයුතු බාර වූ නිලධාරීන් වූ අතර වාරි පද්ධති පාලනය, නඩත්තුව ආදීය ඔවුන්ගේ කටයුතු ලෙස දැක්වේ. මේ පිළිබඳව සැස්සේරුව, (අමරවංශ, 2014: 81) කරදහෙළ (Inscriptions of Ceylon, Vol. v, Part i, 2001: 270-271), කරඹගල (Inscriptions

of Ceylon, Vol. v, Part i, 2001: 270) ආදී සෙල්ලිපිවලින් තොරතුරු හමු වේ. මේ අනුව පුරාතන ලංකාවේ ජල සම්පත් සුරක්ෂාව හා කළමනාකරණය සඳහා ක්‍රමවත් වාරි මාර්ග පද්ධතියක් මෙන් ම ක්‍රියාවලියක්ව තිබූ බව පැහැදිලි වේ.

ගම් පදනම යටතේ ප්‍රධාන ජීවනෝපාය වූ කෘෂිකර්මාන්තයට අවශ්‍ය ජලය පිළිබඳ ව එකල ජීවත් වූ සියලු ගම්වැසියන්ට පොදුවේ අයිතිය තිබූ වැව් ජලය බෙදාහරින නියමිත ස්ථාන විය. මෙහෙයින් වැවෙන් පිටවන ජලය අයුතු ලෙස ප්‍රයෝජනයට ගැනීම හා පුද්ගලික ව ලබාගැනීමට ආදිය ඉඩ නොදීමටත් ජලයෙන් උපරිම ප්‍රයෝජන ගැනීම සඳහාත් ජනයා අනුගමනය කළ යුතු නීති රීති සමූහයක් එකල රාජ්‍ය ප්‍රතිපත්ති තුළින් දක්වා තිබූ බව පෙනේ. මෙහි දී මූලික ව ම ජලය සඳහා රජුගේ අණ මත ජනයාගෙන් බද්දක් ලබාගැනීමට (ජල බදු) ක්‍රියා කළ අතර එතුළින් ජලය පරිහරණය කිරීමේ සීමාවක් ද පැනවෙන අතර එමගින් ජලය සංරක්ෂණය වීමක් ද සිදු වේ. අනුරාධපුර යුගයේ මුල් කාලයේ සිට ම ජලය ලබා ගැනීම සඳහා බදු අය කළ බව ශිලා ලේඛනවල තොරතුරු සඳහන් වේ.

සිතුල්පව්ව ලිපිවලින් (Epigraphia Zelanica, Vol. I, 1994: 41) සෑම කන්නයකින් ම දිය බද්ද අය කළ බව සඳහන් වේ. ජලය සඳහා බදු අය කිරීම අනුරාධපුර අවසාන භාගය වනවිට ද ක්‍රියාත්මක වී පැවතුණි. ලජ්ජක තිස්ස රජුගේ බක්කි ඇළ ලිපියේ (Epigraphia Zelanica, Vol. II, 1924: 17) සඳහන් පරිදි මාරගම වැවෙන් ගත් ජල බද්ද භික්ෂූන්ට පූජා කළ බව කියැවේ. එසේ ම වසභ රජු (ක්‍රි. ව. 67 - 111) විසින් කරවන ලද ඇළහැර ඇළ එම රජු විසින් තිස්මඩමන්හි මුවේල විහාරය කරවා දිය බද්ද විහාරයට දෙන ලද බව ද සඳහන් වේ. එමෙන් ම වසභ රජුගේ පෙරිමියන්කුලම ලිපියේ (මුදියන්සේ, 1971: 203) ද මජ්බික, දකපති ආදී වශයෙන් බදු පිළිබඳ ව සඳහන් කර තිබේ. තව ද ජේතවනාරාම සෙල්ලිපියේ (Epigraphia Zelanica, Vol. I, 1994: 256) ද ජල බද්දක් ගැන සඳහන් කරයි. කුමාරදාස රජුගේ (ක්‍රි. ව. 508-516) නාගිරිකන්ද පර්වත ලිපියේ (Epigraphia Zelanica, Vol. IV, 1994: 116) ද වෙවසර දකපෙත යනුවෙන් දිය බද්දක් පිළිබඳ ව සඳහන්ය. එසේ ම වැව් ජලය පරිහරණය කරන්නන්ගෙන් දිය බෙදුම් වෙනුවෙන් බද්දක් අය කර ගත් බව මොරගොඩ ලිපිය සඳහන් කරයි (Epigraphia Zelanica, Vol. I, 1994: 167). වැවක ජලය සෑම විට ම වී ගොවිතැනට උපයෝගී කරගත් අතර බොහෝ කුඹුරු ආරාමයන් සතු වූ බව පැහැදිලි වේ. මෙලෙස වැව්වලින් පමණක් නොව ඇළ මාර්ගවලින් ද ජලය ගැනීමේ දී බදු අය කිරීමක් සිදු කර තිබේ. භාතිකාභය රජුගේ (ක්‍රි. පූ. 22-27) රාජ්‍ය කාලයේ දී අන්තර් ගංගා ප්‍රදේශයෙහි ඇළ විහාරයෙහි භික්ෂූන්ට දෙන ලද බව රිටිගල සහ මෝලාහිටිය වෙලේගල ලිපිවල සඳහන් වේ (අමරවංශ, 2014: 111, 115).

මෙලෙස ජල බදු අය කිරීමට අමතර ව ජලය සංරක්ෂණය සඳහා ගන්නා ලද පියවරක් වශයෙන් ජල මාර්ගය කොටස් කර ප්‍රයෝජනයට ගැනීම ද දැක්විය හැකි ය. ඒ පිළිබඳ ව ලජ්ජිතිස්ස රජු (ක්‍රි.පූ. 119-103) විසින් මහාරාජ ඇළෙහි ජල කොටස් තුනෙන් එක් කොටසක් පමණක් සංඝාරාමයකට ප්‍රදානය කිරීම යන කරුණෙන් පසක් වේ. මීට අමතර ව මෙම කාලයේ ජල පරිභෝජනය, නීති පද්ධතියකින් ආවරණය කර තිබුණි. ස්වාභාවික සම්පතක් වූ පමණින් ම ජලය අනවශ්‍ය අන්දමින් භාවිත කිරීමට ඉඩක් නොවීය. ඒ අනුව යම් යම් නීති රීතීන්ට යටත් ව ජලය ලබා ගැනීමට සිදුවිය. යම් පුද්ගලයකු වැවෙන් පිටවන ජලය අනිසි ලෙස ගලා යාමට සැලැස්වීම දඩයකට යටත්වීමට සිදුවන හේතුවක් විය. එසේ ම වැවක හෝ ගඟක ජලය පරිහරණය කිරීමේ දී එයට සමීප ව පිහිටි ඉඩම්වල වපුරා ඇති ධාන්‍ය භූමිවලට හානි නොවන ලෙස ජලය සැපයීම කළයුතු වූ අතර එය ජලය අනිසි ලෙස අපතේ යැවීම පිළිබඳ ව යෙදුණු අවධානයකි. හතරවැනි මිහිඳු රජුට අයත් වෙස්සගිරි පුවරු ලිපියෙහි (අමරවංශ, 2014: 233) තිසාවැවේ ජලය භාවිත කිරීම සම්බන්ධයෙන් රජු විසින් පනවන ලද නීති රීති අඩංගු වේ. එසේ ම එහි ම ඉසුරුමුණි වෙහෙරට අයත් තිසා වැවෙන් ජලය ලබා ගන්නා කුඹුරුවල හීනටි වී මිස මුං වගා කිරීම නොකළ යුතු බව ද දක්වා තිබේ.

මෙතුළින් ජල සැපයුම ඉතා ක්‍රමානුකූල ව කළමනාකරණයකින් යුතු ව භෝගවලට අවශ්‍ය පරිදි නිකුත් කළ බව පෙනී යයි. එමගින් පැහැදිලි වන්නේ නියමිත ප්‍රමාණයට පමණක් ජලය ලබා ගැනීම තුළින් ජල නාස්තිය අවම වන බව පෙනී යයි. එමෙන් ම ජලය බෙදා හැරීමේ දී ද, පරිහරණයේ දී ද ආරම්භයේ සිට ම අවසානය දක්වා ම නිසි සේ පරිහරණය කිරීම පිළිබඳ ව රාජ්‍ය ප්‍රතිපත්ති තුළ අවධානය යොමු වී තිබී ඇත. ඒ අනුව වෙස්සගිරි ලිපියෙහි ම කිසිවෙකුගේ අතරමැදි බාධාවකින් තොර ව ජලය ගලා යා යුතු බව සඳහන් කර තිබේ. මීට අමතර ව ජල කළමනාකරණ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා සහයෝගය නොදෙන්නාවුන් සඳහා පැනවිය හැකි දඬුවම් පිළිබඳව ද කොණ්ඩවට්ටවාන් ලිපියේ (අමරවංශ, 2017: 233) සඳහන් වේ. ජලය ගබඩා කිරීම මෙන් ම ජලය බෙදාහැරීම ඒ හා බැඳුණු කාර්යයන් කළමනාකරණය කිරීමෙහි ලා එකල රාජ්‍ය ප්‍රතිපත්ති මනා ලෙස සංවිධානය වී තිබූ බව පෙනී යයි. එසේ ම ජල බදු අයකිරීම, ජලය බෙදාහැරීම, බෙදාහරින ලද ජලය යම් කුඹුරුවලට නියමිත වැවක් මගින් ලබාගැනීම ආදී ක්‍රමානුකූල සැලසුම් යටතේ ජල පාලන සැලැස්ම ක්‍රියාත්මක කරන ලද්දේ සීමිත සම්පතක අගය හා උපරිම පරිහරණයේ අගය එකල දී පැහැදිලි ව ම හඳුනාගත් හෙයිනි.

මීට අමතර ව ජල සම්පත් සුරක්ෂා කිරීම සඳහා ඒවා ජරාජීර්ණ නොවී නිසි නඩත්තු කටයුතු සිදු කරමින් පවත්වාගෙන ගිය බවට ද ශිලා ලේඛන ඔස්සේ තොරතුරුතුරු හමු වේ (Inscriptions of Ceylon, Vol. 2: 92-96). ඒ අනුව විහාරේගල (Inscriptions of Ceylon" Vol. ii, Part i, 1983: 60-61). හා මින්විල ලිපි (Inscriptions of Ceylon, Vol. ii, Part i, 1983: 40) වලින් වැව් ප්‍රතිසංස්කරණය කරමින් නඩත්තු කළ බවත්, සිතුල්පව්ව ලිපියෙන් වැවක් අලුත්වැඩියා කළ ආකාරය පිළිබඳත් තොරතුරු සඳහන් වේ. එසේ ම මේ සඳහා වාරි නිලධාරීන් ද පත්කර සිටි බව තහවුරු වේ (Inscriptions of Ceylon, Vol. ii, Part i, 1983: 261-262). ඒ අනුව මෙමගින් පැහැදිලි වන්නේ රජු, රාජ්‍ය නිලධාරීන්, ජනතාව යන සියල්ලෝ ම සීමිත සම්පතක් වන ජලය සුරැකීමටත් කළමනාකරණය තුලින් උපරිම ප්‍රයෝජන ගැනීමටත් මනා සේ යොමු වූ බව යි. එසේ ම එකල අවශ්‍යතාවය හඳුනාගනිමින් වාරිකර්මාන්ත ඉදිකිරීම් මගින් ජල කළමනාකරණයට යොමු වී ඇති බව ද වසභ රජුගේ වාරි නිර්මාණ පිහිටීම් අනුව හඳුනාගත හැකි ය. ඒ අනුව වියළි කලාපය ආවරණය වන පරිදි ජල කළමනාකරණය ට පියවර ගෙන ඇති බව පෙනී යයි. මනා කළමනාකරණයෙන් යුතු ව ජල සැපයුම් පරිභෝජනය මත ජලය සුරක්ෂිත වීමත් කෘෂිකාර්මික ස්වයංපෝෂිත බව ඇතිවීමත් සිදු වී ඇති බව මෙම කරුණු තුළින් පැහැදිලි වේ. ස්වභාවික සම්පත් අතරින් සීමිත සම්පතක් වූ ජලය ඇති වටිනාකම පැරණි පාලකයන් හඳුනාගෙන, ඒ අනුව නීතීන් ක්‍රියාත්මක කරමින් ජල සම්පත සුරැකීමටත් කළමනාකරණය තුළින් කාර්යක්ෂ ම ව ප්‍රතිඵල ලබා ගෙන ඇති බවත් මේ තුළින් සනාථ වේ.

## 3.3 භූමිය හා පශු සම්පත ආරක්ෂා කර ගැනීම

භූමිය මිනිසාගේ පැවැත්ම ට අවශ්‍ය තවත් වැදගත් සම්පත් ව්‍යුහයකි. පුරාතන ලංකාවේ භූමිය හා පශු සම්පත් සුරක්ෂාව පිළිබඳ අධ්‍යයනය කිරීමේ දී භූමි පරිභෝගකරණය, ඉඩම් කළමනාකරණය හා වාරි තාක්ෂණය ඔස්සේ පශු සම්පත් සුරක්ෂාව ආදිය කෙරෙහි උද්‍යාන හා නගර නිර්මාණය කෙරෙහිලා අවධානය යොමු කර ඇති බව පෙනී යයි. අනුරාධපුර යුගය ආරම්භ වීමත් සමඟ ම අනුරාධපුර නගරය නිර්මාණය වීමේ සිට මෙම කාලය තුළ භූමිය හා පශු සම්පත් සුරක්ෂාව හා කළමනාකරණය කිරීම සඳහා රාජ්‍ය ප්‍රතිපත්ති, අණ පනත් නිර්මාණය වීය.

කලාත්මක අතින් ද සැලකිළිමත් වෙමින් අතීත තාක්ෂණය හා නීතිමය ක්‍රියාමාර්ග ඔස්සේ අනුරාධපුර යුගය තුළ භූමි හා පශු සම්පත් සුරක්ෂාව මනාව සිදුකර ඇති බවට සාක්ෂි හමු වේ. ශ්‍රී ලංකාව සම්පූර්ණයෙන් ම පාහේ කෘෂිකාර්මික පදනමක් මත සිය ආර්ථික ප්‍රතිපත්ති ගොඩනඟාගත් රටකි. මේ හේතුවෙන් භූමිය හා බැඳුණු ස්වාභාවික සම්පත් පොදුවේ භූමිය යන ඒකකය කළමනාකරණය පිළිබඳ ව ද විවිධ නීති රීති හා ප්‍රතිපත්ති විවිධ අවස්ථාවල දී සකස් කර තිබූ බව පෙනී යයි.

වියළි කලාපය තුළ ගොඩනැගුණු අනුරාධපුර රාජධානිය තුළ පස, ජලය, ජල සැපයුම යන කරුණු ආර්ථික කටයුතු ගොඩ නැංවීම කෙරෙහි විශාල බලපෑමක් සිදුකර ඇති බව නොරහසකි. ඒ අනුව පැරණි රාජ්‍ය ප්‍රතිපත්තිය තුළ භූමිය එකහෙළා ම රජුගේ ආධිපත්‍යයට යටත් වූ අතර භූමියේ සම්පූර්ණ අයිතිය හිමි වී තිබුණේ රජුට ය. රටවැසියන්ගේ අභිමතය පරිදි භූමිය පරිහරණය කළ නොහැකි විය. එය රජුගේ අනුමැතිය හා උපදේශකත්වය මත භාවිත කළ යුතු සම්පතක් විය. භූමිය මනාව අවශ්‍යතා සියල්ල ම සමඟ සෘජු ව ම සම්බන්ධ වේ. මේ නිසා භූමි පරිභෝගය පිළිබඳ ව නීති රීති හා ප්‍රතිපත්තිවලින් තොරව එය ආරක්ෂා කිරීමටත්, කළමනාකරණය කිරීමටත් නොහැකි ය. ඒ අනුව අනුරාධපුර යුගයට පෙර සිට ම භූමි පරිහරණය පිළිබඳ ව විවිධ ප්‍රතිපත්ති පැවති බව පැහැදිලි ය. ඒ සඳහා ඔවුන් පොලඹවනු ලැබූ යම් යම් අදහස් ද සමාජයේ පැවති බව දැකිය හැකි ය. එහි දී පැරණි වාස්තු විද්‍යාවට අනුව විශ්වයේ සෑම වස්තුවක් ම එයට හිමි ස්ථානයේ පිහිටි හෙයින් වෙනස් කිරීම අයෝග්‍යය යැයි සඳහන් ය. එසේ ම එලෙස වෙනස් කිරීම මඟින් පරිසරයේ පවතින සමතුලිතතාව බිඳ වැටෙන අතර එයින් පරිසරයේ පවතින ස්වාභාවික නීතිය බිඳ වැටී පරිසරයටත් හානි සිදුවනවා සේ ම ඒ හානිය සෘජුව ම හෝ වක්‍රාකාරයෙන් ජීවියාගේ පැවැත්මට ද බලපාන බව අතීත මානවයා මෙම වාස්තු විද්‍යාවේ ඇති මත ඔස්සේ පසුකාලීන ව තේරුම්ගත් බව දැකිය හැකි ය.

ඒ අනුව පරිසර සංරක්ෂණය කෙරෙහි තමන්ගේ අවශ්‍යතාවන් සඳහා ඉදිකරන ලද කෘත්‍රිම නිර්මාණවල දී අතීත මානවයා සැලකිල්ලක් දක්වා ඇති බවට සාක්ෂ්‍ය පවතී. එහි දී එකල ප්‍රධාන ජීවනෝපාය වූ කෘෂිකර්මාන්ත කටයුතු සඳහා අවශ්‍යය ජලය සලසා ගැනීමට මෙන් ම වාසස්ථාන සඳහා ගොඩනැඟිලි ඉදිකිරීම, ආගමික කටයුතු හා අලංකාරය සඳහා ආගමික උද්‍යාන විනෝද උද්‍යාන ගොඩනැඟීම ආදී කෘත්‍රිම නිර්මාණවල දී පරිසරය සමඟ සමීප ව ජීවත් වූ මෙම මානවයා ස්වභාවික පරිසරයට කිසිඳු බලපෑමක් සිදු නොකිරීමටත් එම පරිසරයට උචිත ආකාරයෙන් විශාල වෙනස්කම් සිදු නොකර, පවතින භූමියේ හැඩය හා තත්ත්වයන් ම යොදාගෙන වඩා ශක්තිමත් ව හා කල්පවතින ආකාරයට මත නිර්මාණ සිදු කිරීමටත් වගබලාගත් බව අතීතය පිළිබඳ ව විමසා බලන විට දක්නට ලැබේ. භූමිය ලෙස හැඳින්වෙනුයේ පෘථිවි තලයේ පාංශු ඇතුළත් භූමි ස්තරයක් පමණක් නොවන අතර පස, ඛණිජ, වනාන්තර, ජීවීන්, ජලය, මානව නිර්මාණිත ආදී සියලු ම ජීව අජීව සම්පත්තියෙන් යුක්ත වූ නිෂ්පාදනය සඳහා ඉවහල්වන සාධක ගණනාවකින් සමන්විත ඒකකයකි. භූමියේ පිහිටීමේ ස්වාභාවය නොහොත් භූ විෂමතා ලක්ෂණ ඉඩම් පරිභෝග කිරීමේ දී ඉතාමත් වැදගත් සහ සාධකයක්

වේ. භූමිය පරිභෝග කිරීමට පෙර එහි ස්වාභාවික පිහිටීමේ  තත්ත්වයන් පවත්වාගෙන පරිහරණය කරන්නේ ද නැතිනම් උචිත ක්‍රම උපයෝගී කරගෙන පරිභෝගය සඳහා යොදා ගන්නේ ද යන්න සිතා බැලීම මත භූමි පරිභෝගය හා ඒ තුළින් භූමි කළමනාකරණයේ සාර්ථක භාවය රඳා පවතින බව කිව හැකි ය. ශ්‍රී ලංකාවේ වියළි කලාපයේ පැරණි ජනපද හා සභ්‍යත්වය ඇතිවීමට මුල් වූයේ වැව් අමුණු, ඇළ, වේලි ආදිය මගින් ජල සම්පාදනය සඳහා පියවර ගැනීම යි. ඒ අනුව එම වාරි තාක්ෂණික අංගයන් නිර්මාණයේ දී භූමිය තුළ පාංශු හා පාෂාණ උද්ගතය පිහිටි ආකාරයෙන් ප්‍රයෝජනයට ගැනිණි. එසේ ම ආරක්ෂාව උදෙසා සීගිරිය වැනි බලකොටු නිර්මාණයයේ දී ද මෙම භූමි තත්ත්වයන් ප්‍රයෝජනයට ගත්හ. මේ අනුව භූමි පරිහරණයේ දී ඒ පිළිබඳ ව වූ මනා භූමි පරිභෝග සැලැස්මක් මගින් ජනතාව එය කරා යොමු කරවීමට අතීත පාලකයන් උත්සුක වූහ. එයට භූමියේ ස්වාභාවික පිහිටීම වන ජලය, වනය,  වනජීවීන් ආදී වූ අංග සියල්ල ම ඇතුළත් විණි.

අනුරාධපුර යුගයේ ප්‍රථමයෙන් ම නගර නිර්මාණය සඳහා යොමු වූයේ පණ්ඩුකාභය රාජ්‍ය සමයේ ය. රජු රාජ්‍ය පාලනය ක්‍රමවත් කරමින් අනුරාධ ග්‍රාමය මූලික කරගෙන ප්‍රධාන නගරය වශයෙන් මුළු ලක්දිවෙහි ම ග්‍රාම සීමා නියම කිරීමය. ක්‍රමවත් පරිපාලන ක්‍රමයක් ඇති කිරීම තුළින් භූමිය භාවිත කිරීමේ දී සැලසුම් සහගත ව ක්‍රියාකර ඇති බව පෙනී යයි. ඒ අනුව නගර නිර්මාණයේ දී, හා ගොඩනැගිලි ඉදිකිරීමේ දී මෙන්ම භූමිය මනා ලෙස වෙන්කර ගැනීමේ දී සැලැසුමක් සහිත ව සිදුකර ඇත. නිවාස සංකීර්ණ, ආගමික ගොඩනැගිලි, සුසාන භූමි, වෙළඳසැල්, වාරිමාර්ග පද්ධති හා මාර්ග පද්ධති සඳහා ඒ ඒ නිශ්චිත ස්ථාන වෙන් කරමින් භූමිය මනා ලෙස පරිභෝග කිරීම සඳහා කටයුතු කර ඇත. එසේ ම අනුරාධපුර නගරය ඉතාමත් ක්‍රමානුකූල ව සැලසුම් කර ඇති අතර ඇතුළු නුවර, පිට නුවර හා උද්‍යාන, ආගමික ස්ථාන ආදිය ද ක්‍රමවත් සැලසුමකට අනුව පිහිටුවා ඇති බව දැකිය හැකි අතර එමගින් ද  භූමිය කළමනාකරණය කර ඇති බව පැහැදිලි ය. පැරණි අනුරාධපුර නගරය පිහිටීම සිතියම නිරීක්ෂණය තුළින් මෙලෙස මනාව භූමිය බෙදා වෙන්කර ගැනීමේ ප්‍රතිපත්තිය පැහැදිලි වේ. නගරයක තිබූ සැලසුම් සහගත ඉදිකිරීම් මේ තුළින් සනාථ වන අතර නගර සැලසුමක් තුළ ඒ ඒ කාර්යයන් සඳහා භූමිය වෙන් කිරීමේ දී බොහෝ පිළිගත් කරුණු කෙරෙහි රජවරුන් විසින් අවධානය යොමු කරන ලද්දේ දැයි පෙනේ. බදුල්ල ටැම් ලිපියේ ද (මුදියන්සේ, 1971: 253-267) වෙළඳසැල්, නිවාස ආදී වශයෙන් එකිනෙකට වෙන් වූ ස්ථාන සහිත පැහැදිලි භූමි සැලසුම් සහිත හා ඒවා පාලන සැලසුම් තිබූ බව පෙනේ. මීට අමතර ව භූමි හා පශු සම්පත් සුරක්ෂාව පිළිබඳ ව විග්‍රහ කරන විට පෙනී යන කරුණක් වන්නේ ජනයාට රජුගේ අවසරයෙන් තොරව භූමිය පරිභෝග කිරීමට අයිතියක් නොවූ බවත් ඉඩම් භුක්ති විඳීම වෙනුවෙන් රජුට බද්දක් ගෙවීමට සිදු වූ බවත් ය. ඒ තුළින් භූමිය ආරක්ෂා කිරීමට හා කළමනාකරණය කිරීම සඳහා ජනයා එකල යොමු වූහ.

තව ද වාරි නිර්මාණ ආශ්‍රය කරගනිමින් ම පාංශු සංරක්ෂණ ක්‍රියාවලියක් මෙරට තුළ ඇති විය. වාරිමාර්ග නිර්මාණයේ දී භූමියේ ස්වාභාවික පිහිටීම ඒ ආකාරයෙන් ම ප්‍රයෝජනයට ගත් අතර පාංශු සංරක්ෂණය කිරීමේ දී ද ස්වාභාවික ව ඇතිවන පෝෂණ කොටස්වලින් ප්‍රයෝජන ගැනිණි. වැවක් සාදා ගත් පසු එහි පෝෂක ප්‍රදේශයෙන් රොන්මඩ පැමිණ තැන්පත් වේ. එම රොන්මඩ වියළි කාලයේ දී වැව් බැම්මෙන් සේදී ගොස් කුඹුරු යායට එක් වේ. මේ අනුව වැව් නිර්මාණයේ දී පසෙහි පෝෂක තත්ත්වය මේ ආකාරයෙන් රඳවා ගන්නට ඇත්තේ පස් සංරක්ෂණය කිරීමේ අරමුණු ඇති ව යැයි සිතිය හැකි ය. මීට අමතර ව උද්‍යාන නිර්මාණකරණය භූමි කළමනාකරණය කිරීමේ තවත් අංශයක් වශයෙන් අනුරාධපුර යුගයේ දී හඳුනාගත හැකිය. අනුරාධපුර යුගයේ දී උද්‍යාන සඳහා විශාල භූමි ප්‍රමාණයක් වෙන් කර තිබේ. මෙම උද්‍යානකරණය භූමිපරිභෝග ක්‍රමයේ දී වඩා වැදගත් තැනක් උසුළයි. නගර සැලැසුමක් තුළ උද්‍යාන පිහිටුවීම, වියළි කලාපයේ දේශගුණික තත්ත්වය අනුව වැදගත් වන්නට ඇත.

ඒ අනුව රජවරු මහවතු හා උයන් නිර්මාණය කළ බව සාහිත්‍ය මූලාශ්‍රයවල සඳහන් වන අතර භූමියේ ස්වාභාවික පිහිටීම උද්‍යාන සඳහා ප්‍රයෝජන කරගන්නා ලද බවත්, උද්‍යාන නිර්මාණයට හා ආරක්ෂාවට කම්ටු පත්කර තිබූ බවත් බදුලු ටැම් ලිපියෙහි (මුදියන්සේ, 1971: 253-267) සඳහන් වේ. උද්‍යාන  නිර්මාණකරණය ගත් විට අනුරාධපුර යුගයට අයත් වැදගත් නිර්මාණයක් ලෙස සීගිරි නගර නිර්මාණය ද හඳුනාගත හැකි යි.  සීගිරි නගර නිර්මාණය නිරීක්ෂණය කිරිමේ දී එය පරිසරය ට උචිත ලෙස සකස් කරන ලද සැලසුමක් බව පෙනී යයි. මෙහි දී භූමිය පරිහරණය කිරීමේ දී ස්වාභාවික පිහිටීම ආරක්ෂක බලකොටුවක් ආකාරයට පරිවර්තනය කරමින් නිර්මාණය කර ඇත. සීගිරි ගල මුදුන මාලිගය සඳහා මෙහි දී යොදාගත් අතර කොටුබැම්ම, ජල උද්‍යාන  ආදී සියල්ල සැලැස්මක ට අනුව යොදා තිබීම මත මෙම භූමියේ සුවිශේෂී කළමනාකරණයක් ඇති බව දැකිය හැකි වේ.

එමෙන් ම කළමනාකරණය කිරීම සඳහා අතීත පාලකයන් විසින් විවිධ වූ ක්‍රියාමාර්ග ගන්නා ලද අතර මෙහි දී ඒ පිළිබඳ ව දැක්වූ නීති අණ පනත් පිළිබඳ ව අවධානය යොමුකළ හැකිය. බෞද්ධාගම ස්ථාපිත වීමත් සමඟ භික්ෂූන් වහන්සේ හා විහාරාරාම වෙනුවෙන් භූමි කොටස්  වෙන් කිරීම හෝ ඉඩම්වල ආදායම් පැවරුණි. ඒ පදනම මත භූමිය හා පශු සම්පත් ආරක්ෂා කිරීම ට හා කළමනාකරණය සඳහා රාජ්‍ය ප්‍රතිපත්ති සකස් වීම දැකිය හැකි ය. ඒ අනුව පුලියන්කුලම සෙල්ලිපියේ (මුදියන්සේ, 1971: 200) සංඝාරාමයකට අයත් ගම, භූමිය මෙන් ම මිනිසුන් ද ආරක්ෂා කළයුතු බව සඳහන් වේ. මෙම ඉඩමට ඇතුළු වීම හෝ එහි ගස්

කැපීම තහනම් කර ඇත. කිරිබත්වෙහෙර ටැම් ලිපියේ ද කඳු සහිත භූමිය උඩ වේගිරිවත්ත නම් ප්‍රදේශය ආරක්ෂා කිරීමට විශේෂ අවධානයක් යොමුකර තිබූ බවත් එසේ ම එම ඉඩමේ මායිම වශයෙන් බමුණු කුඹුර, වෙහෙරවත්ත, දකුණින් මී ගස උතුරින් කැලය ද මායිම් වී තිබූ බව දක්වයි (අමරවංශ, 2014: 169). මෙයින් පැහැදිලි වන්නේ ඉඩම්වල මායිමේ කැලයක් තිබීමෙන් ඉඩමේ පස සංරක්ෂණය සඳහා එය ප්‍රයෝජනවත් වන බව අතීතයේ තිබූ අදහසක් බවයි. තව ද ඉඩම් පාලනය සඳහා කම්ටු පත් කිරීම ද භූමිය හා පාංශු සංරක්ෂණයේ විශේෂ අවධානය යොමු කළ කරුණකි. උද්‍යානයක් පාලනය සඳහා උද්‍යාන කම්ටු ද, කැලෑ භූමි පාලනය සඳහා කැලෑ කම්ටු ද, කෙත්වතු සඳහා වෙනම කම්ටු ද පත්කර තිබූ බව ශිලාලේඛන තුළින් පැහැදිලි කරයි. එසේ ම කොක්ඇඹේ සෙල්ලිපියේ (Epigraphia Zelanica, Vol. II, 1924: 121) රාජකීය පවුලකට අයත් ඉඩම්, කුඹුරු හා ඒ අසල කැලය ද එහි ආදායම, ගහකොළ, සතා සිවුපාවුන් යන සියල්ල ම පවරාදීමක් පිළිබඳ කිය වේ. මෙමඟින් ඉඩමක් යනු භූමියක් පමණක් නොව භූමිය හා බැඳුණු සියල්ල ම බව පැහැදිලි වේ.

තවද සෑගිරි හා අභයගිරි විහාරයට අයත් ඉඩම්වලට අනවසරයෙන් ඇතුළු වීම හෝ එහි ඇති ගස් කපා දැමීම තහනම් බවත්, ඇත් වෙහෙර පායාල නම් භූමිය නිලධාරීන් විසින් ආරක්ෂා කළයුතු බවත් මිහින්තලා පුවරු ලිපියේ (මුදියන්සේ, 1971: 268-293) දැක්වේ. මේ කරුණු අනුව භූමිය හා වගාවන් ආරක්ෂා කරගැනීම සඳහා රාජ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක වූ බව පැහැදිලි ය. තව ද බුද්ධන්නේහෙළ කුළුණු ලිපියෙහි (Epigraphia Zelanica, Vol. I, 1994: 191) අසුන් බෑ වත්ත, බෝවත්ත, ඇන්දිගිරිවත්ත, නොනාගිලි, ගනගිලි යන වතු හා කුඹුරු සියල්ල ම පැවරීමේ දී එහි ඇති වී, තල, බුලත්, දොඩම්, දෙල්, කොස් ආදී වගාවන් මෙන් ම ගෙබිම් ඉඩම් පරිහරණය කිරීම පිළිබඳ ව ද භික්ෂූන් ට ඇති අයිතිය පෙන්වයි. මේ කරුණු අනුව පැහැදිලි වන්නේ භූමියේ නිසි පැවැත්ම ට අවශ්‍ය ලෙස භූමියේ කළයුතු වගාවන් ද සංරක්ෂණය කළ යුතු ය යන්න යි.

එසේ ම හතරවැනි දප්පුල රජුගේ (ක්‍රි. ව. 924-935) කොණ්ඩවට්ටවාන් ලිපියේ (Epigraphia Zelanica, Vol. I, 1994: 51) ද ඉඩම් පරිපාලනය පිළිබඳ සඳහන් ව ඇත. එහි කියැවෙන පරිදි ඉඩමක් බදු දීමේ ක්‍රමය "පන" ක්‍රමය නම් විය. මෙම බදු අය කිරීම සඳහා වෙන ම සංවිධාන හා නිලධාරීන් සිට ඇත. වතුයායක් වෙනුවෙන් අයකළ බදු පිළිබඳ ව හතරවැනි කාශ්‍යප රජුගේ (ක්‍රි. ව. 963-980) ලිපියක ද දැක්වේ.

එසේ ම හතරවැනි මිහිඳු රජුගේ ලිපියක (Epigraphia Zelanica, Vol. I, 1994: 118) ද සමහර ඉඩම් පරිපාලනය සඳහා නියෝග පැන වූ බව සඳහන් වේ.

## 4. නිගමන සහ නිර්දේශ

මෙම කරුණු පදනම් කරගෙන සඳහන් කළ හැකිවන්නේ සමකාලීන යුගය වනවිට පාරසරික සම්පත් සුරක්ෂා කිරීමේ හා කළමනාකරණය කිරීම පිළිබඳ ව රාජ්‍ය ප්‍රතිපත්තිය ඉතා පුළුල් ලෙස වර්ධනය වී තිබූ බවයි. කෘෂිකාර්මික ආර්ථිකයක් වූ පැරණි ලංකාවේ සෞභාග්‍යය හා ප්‍රගතිය පැවතුණේ භූමිය පරිහරණය කිරීමේ දී එහි ස්වභාවය හා ජලය යන සම්පත් ඥානාන්විත ව පාලනය කිරීම මත ය. එහෙයින් එකල තිබූ භූමි පරිභෝගකරණය සැලසුම් සහගත විය. පාරිසරික සම්පත් කළමනාකාරීත්වයකින් තොර ව භාවිත වීම නිසා වර්තමානය වන විට උග්‍ර අර්බුද රැසකට මිනිසා මුහුණ පා තිබෙන නිසා එම අර්බුද විසඳාගැනීම සඳහා අතීත පාරිසරික සංරක්ෂණ ප්‍රතිපත්ති මගින් ආදර්ශ සපයා ගත හැකි ය. එබැවින් අතීත පාලකයන් විසින් අනුගමනය කරන ලද පාරිසරික සංරක්ෂණ ප්‍රතිපත්ති අතීතයට මෙන් ම වර්තමාන ක්‍රියාකාරීත්වයටත් අතිශයින් උපයෝගි බව නිගමනය කළ හැකි ය.

## 5. ආශ්‍රිත ග්‍රන්ථ


අමරවංශ හිමි, කේ. (2017). *ලක්දිව සෙල්ලිපි,* කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

අධිකාරම්, ඊ. ඩබ්. (2013). *පැරණි ලක්දිව බෞද්ධ ඉතිහාසය*, කොළඹ: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

කරුණාරත්න, එස්. (2000). ශිලාලේඛන සංග්‍රහය, i වෙළුම (1904-1912), කොළඹ: පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව.

*ජාතක පාළි* i, (1996). භූරිපඤ්ඤ ජාතක, බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලාව, කොළඹ: ඇස් ගොඩගේ සහ සහෝදරයෝ.

දීඝනිකාය i, (1996). කූටදන්ත සූත්‍රය, බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලාව, කොළඹ: ඇස් ගොඩගේ සහ සහෝදරයෝ.

ෆෝන්සේකා, එල්. (2006). *අතීත රජදරුවන්ගේ පාරිසරික ප්‍රතිපත්ති*, කොළඹ: සීමාසහිත ඇම්. ඩී. ගුණසේන සහ සමාගම.

බණ්ඩාර, එන්. (1959). *පුරාණ ශ්‍රී ලංකාවේ සමාජය,* කොළඹ: කඩුල්ල ප්‍රකාශන.

*මහාවංසය* (1996). සුමංගල හිමි හා දේවරක්ෂිත, බටුවන්තුඩාවේ (සංස්.), කොළඹ: ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව.

මුදියන්සේ, එන්. (1971). *ශාස්ත්‍රීය ලිපි සංග්‍රහය*, කොළඹ: සීමාසහිත ඇම්. ඩී. ගුණසේන සහ සමාගම.

සුරවීර, ඒ. වී. (1959). *අනුරාධපුර සංස්කෘතිය*, කොළඹ: ඇස් ගොඩගේ සහ සහෝදරයෝ.

*Epigraphia Zeylanica*, Vol. I,(1994).Wickramasinghe, Don Martino De Silva (ed.). Asian Educational Services.

*Epigraphia Zeylanica,* Vol. II, (1924). Wickramasinghe, Don Martino De Silva. (ed.). Asian Educational Services.

*Epigraphia Zeylanica*, Vol. III, (1994). Wickramasinghe, Don Martino De Silva & CodringtonH.W., H.W. (ed). Asian Educational Services.

*Epigraphia Zeylanica*, Vol. V, Part I, (1955). Paranavitana, S. (ed.). Government Press.

*Inscriptions of Ceylon,* Vol. 1, (1970). S. Paranavitana. The Department of Archaeology.

*Inscriptions of Ceylon,* Vol. 2 (1990). Nandadewa Wijesekara, Colombo: The Department of Archaeology.

*Inscriptions of Ceylon, Vol. 11, Part 1,* (1983). S. Paranavitana, The Department of Archaeology.

*Inscriptions of Ceylon, Vol. v, Part 1,* (2001). Sirimal Ranawella, The Department of Archaeology.

*Inscriptions of Ceylon, Vol. v, Part ii,* (2004). G. S. Ranawella, The Department of Archaeology.